

උපුල් ජෝසප් ප්‍රනාන්දුගේ
ගුරුදු විග්‍රහය

අහසින් පොළොවට

P ≫ 04

මිල රු.80
රුපියල් 80ට දෙන ලංකාවේ එකම පත්තරය

2024.04.28 ඉරිදා | පස්වැනි කාණ්ඩය | 43 වැනි කලාපය

දැන් ඉරිදා

# මව්රට

ජනාධිපතිවරණයට
තව දින 155

# ජනාධිපතිගෙන් කෝටි 32ක් ගත්ත විපක්ෂ මන්ත්‍රීලාගේ පටිරෝල්

## ඒ මන්ත්‍රීලා ගැන තීන්දුවක් ගන්නවා - සජබ මහලේකම්

P ≫ 02



# සජබ සන්ධානය කඩන්න ලොකු කොන්ත්‍රාත් එකක්

P ≫ 02



## ධම්මික පෙරේරා තීන්දුවක් ගනී

P ≫ 02

## රනිල් - විජේදාස මුහුණට මුහුණ සාකච්ඡාවක්

P ≫ 02



විපක්ෂයේ සිට මුට්ටිය අල්ලලා

# බාර් ලයිෂන් ගන්න මැදිහත් වූ මන්ත්‍රීවරුන්ගේ නම් ලැයිස්තුවක් එළියට එනවා

P ≫ 02

## කඩේ කුණු කෑම කන්න එපා පාචනය හැම තැනම

ප්‍රේමලාල් විජේරත්න

නාගරික ස්ථානවල මෙන්ම ගම් ආශ්‍රිතව සෞඛ්‍යාරක්ෂිත නොවන ආකාරයට ආහාර ද්‍රව්‍ය අලෙවි කරන ස්ථානවලින් ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම නිසා පාචනය රෝගය පැතිරී යෑමේ අවදානමක් පවතින බව කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලේ ළමා රෝග විශේෂඥ වෛද්‍ය දීපාල් පෙරේරා මහතා 'මව්රට'ට පැවැසීය.

## මැයි රැලිවලට පොලිසියෙන් 4000ක්

ප්‍රේමලාල් විජේරත්න

P ≫ 02

## මිනිස්සු ඝාතනය කරන සමාගම් මාෆියාවක් ගැන සජිත්ගෙන් බය හිතෙන හෙළිදරව්වක්

නිලන්ති රේණුකා

කරන්දෙණියේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මෙන්ම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ භාණ්ඩාගාරික ලෙස කටයුතු කළ දිලීප රොෂාන් කුමාර මහතා පෙබරවාරි 26 වැනි දින කුරුඳුගහ හැතැක්ම දිවිතුරුගම සිය නිවෙසේදී ඝාතනය කර මේ වන විට මාස දෙකක් ඉක්ම ගොස් ඇති නමුත්, ඊට අදාළ කිසිදු සැකකරුවකු පිළිබඳ හෝඩුවාවක් හෝ ආරක්ෂක අංශ විසින් සොයාගෙන නොමැති බව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පාර්ලිමේන්තුවේදී පැවැසීය.

P ≫ 02

## රටම හෙල්ලෙන ප්‍රකාශයක් කිරිඇල්ල පාර්ලිමේන්තුවේදී සිදුකරයි

නිලන්ති රේණුකා

විපක්ෂයේ සිට ආණ්ඩුවට එක්වූ සජබ මන්ත්‍රීවරුන් දෙදෙනකුගේ නඩුව මේ වනවිට විභාග කොට අවසන් කර මාස 3ක් වන නමුත් තීන්දුව මෙතෙක් ප්‍රකාශයට පත්කර නොමැති බව ලක්ෂ්මන් කිරිඇල්ල මහතා පාර්ලිමේන්තුවේදී පැවැසීය.

P ≫ 02

## ගිය අවුරුද්දේ ලක්ෂ 14ක් රටින් ගිහිල්ලා

ප්‍රේමලාල් විජේරත්න

පසුගිය වසරේදී රටින් පිටවී විදේශගතවී ඇති සංඛ්‍යාව 14,37,607ක් බව මහබැංකු වාර්තා හෙළිකර ඇති බව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා සහ සංඛ්‍යාන අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වසන්ත අතුකෝරල මහතා 'මව්රට'ට පැවැසීය.

P ≫ 02

## කොච්චර පැව්වත් ගංවතුරක් එනවා

ප්‍රේමලාල් විජේරත්න

P ≫ 02

# කිරිබත් ජාත්‍යන්තරයට අරන් ගිය දුවෙක්

# ඔබ අපේ අභිමානයයි

**ලාංකිකයන් වුණු අපේ ජීවිතවල සුබ කටයුත්තක් ආරම්භ කරද්දී විශේෂ ආහාරයක් පිසිනවා. ඒ තමයි කිරිබත්. සිංහල සංස්කෘතිය හා වසර ගණනාවක් තිස්සේ බැඳුණු මේ කිරිබත් පිසීමේ සම්ප්‍රදාය මේ වෙද්දී ජාති භේදයක් නැතුව ශ්‍රී ලාංකිකයන් බොහෝ දෙනෙක් හදන කෑම වර්ගයක් බවට පත්වෙලා තියෙනවා. රතු හෝ සුදු කැකුළු සහලින් සකසාගත හැක කිරිබතේ ඇති පෝෂණීය සහ ඖෂධීය ගුණය ගැන ආයුර්වේදයේ විශේෂයෙන් සඳහන් කරලා තියෙනවා. අද අපි ඔබට කියන්න යන්නේ අපේ රටට ආවේණික වූ, අපේ සංස්කෘතියේ සුවිශේෂ අංගයක් වූ, අපි හැමෝම ආදරය කරන අපේ කිරිබත ඔස්ට්‍රේලියාවේ සූපශාස්ත්‍ර තරගයකින් ලබපු ජයග්‍රහණයක් ගැනයි.**





> බෞද්ධ දහමේ පමණක් නොව හින්දු දහමේද කිරිබතට හිමිවන්නේ සුවිශේෂ තැනක්. විවාහ මංගල උත්සවවලදී පෝරුව මත කිරිබත් අතුරා යුවළට ආශීර්වාද කර සෞභාග්‍යය පැතීම හින්දු සංස්කෘතියේ සුවිශේෂ අංගයක්.



නිලන්ති රේණුකා

MasterChef Australia කියන්නේ ඔස්ට්‍රේලියාවේ ප්‍රවීණ සූපවේදීන් මඬුල්ලකගේ අධීක්ෂණය යටතේ පවත්වනු ලබන ආහාරවල රසය සොයා බලන තරගයක්. එරට ජීවත් වන ශ්‍රී ලාංකික තරුණියක් වන සවින්ද්‍රි පෙරේරා තමයි මේ තරගයට කිරිබතක් පිසලා ඉදිරිපත් කළේ. ඇය එම කිරිබත ඉතා රසවත්ව සහ අලංකාරවත්ව පිස පසුගිය 23 වැනිදා පැවැති MasterChef Australia තරගය වෙනුවෙන් ඉදිරිපත් කරන්නට කටයුතු කර තිබුණා.

කිරිබත අපේ රටේ විවිධ විදියට සකසන්නට අපි පුරුදුවෙලා ඉන්නවා. ඉඹුල් කිරිබත්, මුංඇට මිශ්‍ර කිරිබත්, සාමාන්‍ය කිරිබත් වගේම විවිධ පළාත්වලට අනන්‍ය වූ ආකාරයට විවිධ රසයන්ගෙන් කිරිබත් පිසින්නත් ශ්‍රී ලාංකිකයන් හරි දක්ෂයි. සවින්ද්‍රි පෙරේරාත් කිරිබත විවිධ රසවලින් සකස් කරලා අපේ රට නියෝජනය කරන්න එය ඉදිරිපත් කරලා තිබුණා.

කිරිබතේ ඉතිහාසය ගැන සඳහන් කරද්දී අපට මතක් වෙන්නේ බෞද්ධ ඉතිහාසයේ සඳහන් කතාවක්. දම්සක් පැවතුම් සූත්‍රය අසා මුලින්ම කොණ්ඩඤ්ඤ හිමියන් සෝවාන් ඵලයට පත්වූ අවස්ථාවේ විපස්සී හිමියන්ට ගිතෙල් මීපැණි මිශ්‍ර කිරිබතක් පිදීමේ සිද්ධියයි.

බෞද්ධ දහමේ පමණක් නොව හින්දු දහමේද කිරිබතට හිමිවන්නේ සුවිශේෂ තැනක්. විවාහ මංගල උත්සවවලදී පෝරුව මත කිරිබත් අතුරා යුවළට ආශීර්වාද කර සෞභාග්‍යය පැතීම හින්දු සංස්කෘතියේ සුවිශේෂ අංගයක්.

කෙසේ වෙතත් සවින්ද්‍රිගේ කිරිබත MasterChef Australia තරගයෙන් ජයග්‍රහණය කළා. විනිසුරුවරුන් සවින්ද්‍රිගේ කිරිබත ප්‍රශංසාවට ලක්කරනු ලැබුවේ එය අලංකාරවත් චිත්‍රයක් (It's like a painting) බව පවසමින්. සවින්ද්‍රි එය පොල්කිරි, පැණි සහ ඇඹුල්තියල් කරන ලද මාළුවකු සමග අලංකාරවත් ලෙස සකසා ඉදිරිපත් කර තිබුණා.

ජයග්‍රහණයෙන් පසුව තරගය මෙහෙයවූ සූපවේදීන් සවින්ද්‍රි ගැන විමසා සිටියා. එහිදී ඇය ලස්සන කතාවක් කිව්වා.

'ගෙදරට එන අය ආපු ගමන් ආපහු හැරිලා යනවා නම් මම මගේ රාජකාරිය හරියට කරලා නැහැ. මම සත්කාරකත්වයට කැමැතියි. ශ්‍රී ලාංකිකයන් බොහෝ විට ආහාර ගන්නේ පවුලේ හැම දෙනාම එකට එකතුවෙලා...' ඇය පවසා සිටියා.

ඔවුන් ඇගෙන් නැවත විමසා සිටියේ ඇය ඉදිරිපත් කළ ආහාර වර්ගය ගැනයි.

සූපවේදීන් :

මොකද්ද ඔබ ඉදිරිපත් කළ ආහාරය ? (What is this)

සවින්ද්‍රි : මේ ශ්‍රී ලංකාවේ උදෑසන ආහාරයක්. කිරිබත් ලෙසයි හඳුන්වන්නේ. (That is Sri Lankan breakfirst. Which is milk rice)

ඇය ඉදිරිපත් කළ ආකර්ෂණීය කිරිබත තරගයෙන් ජයග්‍රහණය කිරීමත් සමග ඔස්ට්‍රේලියානු කාන්තාවක් ඔල්වරසන් හඬ නගමින් කෑගසන අයුරුද දැකගන්නට ලැබුණා.

සවින්ද්‍රිගේ ජයග්‍රහණට හේතු දක්වමින් විනිසුරු මඬල්ල ඇගේ කිරිබතේ සුවිශේෂත්වය අගය කර තිබුණේ මේ අන්දමටයි.

'මේ සඳහා යොදාගත් සෝස් හරිම නැවුම්. රසය අව්‍යාජයි. (The flavour is just impaccable). මාළුවා හරි ලස්සනයි. (Fish is beautiful). රසවත් (It is delicious) කිරිබත රසවත් ලෙස පිස තිබෙනවා. (Perfectly cooked). ඇදහිය නොහැකියි. (Incredible). පෝෂණය අතින්ද ඉහළ තත්ත්වයක පවතී. මේ කිරිබත සෝස්, පැණි රස කුළුබඩු රස වගේම ඇඹුල් රසින්ද යුක්ත වුණා. (on top of that I'm getting spice. sweetness and sourness). ඔබගේ පරිශ්‍රමය මේ කිරිබත් පිඟානේ කැපීපෙනුණා. හැම තැනක් ගැනම සොයා බලා හොඳින් සකසා තිබුණා. (well done). මේ ආහාර පිඟාන අපිට සමරන්න පුළුවන්. මේ කිරිබත අපිට ඕනෑම වෙලාවක උදෑසන දහවල් ආහාරය වගේම රාත්‍රී ආහාරය සඳහාත් යොදාගන්න පුළුවන්....'

සවින්ද්‍රිගේ ජයග්‍රහණය සමරමින් ඔස්ට්‍රේලියානු ජාතික කාන්තාවක් ඔල්වරසන් දෙන අන්දමද විශේෂයෙන් කැපී පෙනුණා.

සවින්ද්‍රි පෙරේරා සැකසූ කිරිබත තරගයේ විනිසුරුවන් ලෙස සිටි සූපවේදීන් රස බැලීමෙන් අනතුරුව ඔවුන් පුදුමයට පත්ව තිබූ අතර, ඔවුන් සඳහන් කර තිබුණේ මේ තරම් රසවත් ආහාරයක් තමන් මීට පෙර රසබලා නොතිබූ බව පවසමින්.

"Really, really good sri lankan food is..." ඔවුන් පැවැසුවේ සවින්ද්‍රි මෙම කිරිබත හොඳටම සකසා ඇති බවයි (well done). එම කිරිබත විටෙක ස්පයිසි රසය ගෙන දුන්නා. විටෙක පැණි රසය ගෙන දුන්නා.

තමන් ලැබූ ජයග්‍රහණය සවින්ද්‍රිට එක වරම අදහාගන්නට බැරිව ගිය අතර, ඇය ගල්ගැසී සිටි ආකාරයද දැකගත හැකි වුණා.ශ්‍රී ලංකාවේ නාමය, ශ්‍රී ලාංකේය රසය දුරු රටක ඉහළින්ම සටහන් කළ සවින්ද්‍රි පෙරේරා තවමත් පසුවන්නේ 30 වැනි වියේ. ඇය කොළඹ හැදී වැඩුණත් නිතරම ගමේ දේට තැන දුන්නා. සවින්ද්‍රි පවසන්නේ ඇයට මෙලෙස රසවත් ආහාර පිසීමේ හැකියාව ලැබුණේ තම මවගෙන් බවයි. අවාසනාවකට ඇගේ මව 2017 වර්ෂයේදී ජීවිතෙන් සමුගෙන ගිය බවත්, MasterChef Australia අභියෝගය ජයගැනීමට මවගේ ආශීර්වාදය ලැබුණු බවත් සවින්ද්‍රි සඳහන් කළා.

අද වෙද්දී අපේ රටේ බොහෝ කාන්තාවන් ආහාර පිසින්න දක්වන්නේ මැළිකමක්. ක්ෂණික ආහාරයක් පිසගෙන බඩගින්න නිවාගන්න තමයි ඔවුන් උත්සාහ ගන්නේ. නමුත් අපේ රටේ කොයිතරම් රසවත් ආහාර වර්ග තියෙනවද? පහසුවෙන් පිසගත හැකි රසවත් මෙන්ම ගුණදායී ආහාර වර්ග සිය දහස් ගණනක් අපේ ආහාර සංස්කෘතිය ඇතුළේ තියෙනවා. ඒ රසවත් ආහාර ලංකාවට එන විදෙස් සංචාරකයන්ට පිළිගැන්වීම හරහා සංචාරක කර්මාන්තය ඉහළටම ඔසවා තබන්න පුළුවන්කම තිබෙනවා.

තමන්ගේ අතින් රසවත් ආහාරයක් පිසින්න නම් ආදරයක් ආශාවක් තියෙන්න ඕනේ. නමුත් අද බොහෝ කාන්තාවන් ඒ කාර්යය මග හරිනවා. සවින්ද්‍රි කියන්නේ අපේ රටේ කාන්තාවන්ට ආදර්ශයට ගතහැකි කදිම උදාහරණයක්. සවින්ද්‍රි ඔස්ට්‍රේලියාවේ ජීවත් වුණත් අපේ දේ අපේකම අගය කළා. අපේ රටේ දේ ජාත්‍යන්තරයට ගෙන යන්න ඇය කටයුතු කළා. ශ්‍රී ලාංකිකයන් විදියට අපට උරුම වුණු ආහාර සංස්කෘතිය ජාත්‍යන්තරයට ගෙන යන්න සවින්ද්‍රි පෙරේරා සමත් වුණා. අපේ කිරිබත දැන් ඔස්ට්‍රේලියාවේ රසවතුන් අතර දිනෙන් දින ප්‍රසිද්ධ වේවි. ඒ හරහා විදේශිකයන් රසවත් ආහාර පාන සොයාගෙන අපේ රටට එන එක තවත් වැඩිවේවි. බොහෝ කැපකිරීම් කළ සවින්ද්‍රිට ලැබුණේ පෞද්ගලික ජයග්‍රහණයක් නෙවෙයි. ඒක ශ්‍රී ලංකා මාතාව ලැබූ ජයග්‍රහණයක්. ඉතින් අපි හැමෝම සවින්ද්‍රිට ලංකාවේ නම තව තවත් ඉදිරියට අරගෙන යන්න හැකියාව ලැබේවා

PAGE - 01

## රටම හෙල්ලෙන...

ඒ මහතා පෙන්වා දුන්නේ විනිශ්චයකාරවරුන් දෙදෙනකු මෙහි තීන්දුව ලියා ඇති නමුත් එක් විනිශ්චයකාරවරයකු තීන්දුව ලිවීමට අදිමදි කරමින් සිටින බවය.

මේ තීන්දුව ලබාදීම ප්‍රමාද කිරීම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් බව කී මන්ත්‍රීවරයා මෙවර එම විනිශ්චයකාරවරයාගේ නම හෙළිදරව් නොකරන බවත්, ඊළඟ වතාවේදී එය පාර්ලිමේන්තුවට හෙළි කරන බවත් කියා සිටියේය.

## මිනිස්සු ඝාතනය...

මොහු මේ රටේ ජනතාවට විෂ සහිත ආහාර කවන්නට කටයුතු කළ මහා පරිමාණ සමාගම් සමග විශාල සටනක නිරත වූ බවත්, වෘත්තිය වෙනුවෙන් කැපවූ මේ පුද්ගලයාගේ ඝාතනය ගැන සොයන්න අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට බාර දුන්නත් ප්‍රතිඵලයක් නොමැති බවත්, මෙම සමාගම් රටේ නීතියේ ආධිපත්‍යයට බලපෑම් කරනවාද කියන සැකයක් ජනතාව තුළ පවතින බැවින් ඒ සම්බන්ධ විධිමත් පරීක්ෂණයක් සිදුකරන ලෙසත් විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා එහිදී පැවසීය.

## බාර් ලයිසන්...

විපක්ෂයේ සිටින මන්ත්‍රීවරුන් කිහිප දෙනකු ආණ්ඩුවත් සමග සමීපව ගනුදෙනු කොට සිය ව්‍යාපාරික හිතවතුන්ට මත්පැන් බලපත්‍ර ලබාදී ඇති බවට බරපතළ චෝදනාවක් මේ වන විට විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන්ම එල්ලවී තිබේ.

මෙම චෝදනාව පසුගිය සතියේදී මුල්වරට ඉදිරිපත් වූයේ ආගමික නායකයන් කිහිප දෙනකු විසිනි. ඔවුන් විපක්ෂ නායකවරයාටත්, විපක්ෂයේ දේශපාලනඥයන් කිහිප දෙනකුටත් දැනුම් දී තිබුණේ සිය ගම් පළාත්වල මත්පැන් හල් විවෘත කිරීම සඳහා අවශ්‍ය බලපත්‍ර ලබාදීමට විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිප දෙනකු මැදිහත් වී ඇති බවකි.

ඒ සම්බන්ධයෙන් වහාම විමර්ශනයක් කරන ලෙසට එම ආගමික නායකවරු විපක්ෂ නායකවරයාගෙන් ඉල්ලීමක් කොට තිබිණි.

මීට අමතරව පසුගිය සිකුරාදා දිනයේදී ඩලස් අලහප්පෙරුම මහතාද පාර්ලිමේන්තුවේදී සඳහන් කර සිටියේ මත්පැන් බලපත්‍ර ලබාදීමට විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිප දෙනකු මැදිහත් වී ඇති බවත්, ඒ සියලු දෙනාගේ නම් රටට හෙළිදරව් කළයුතු බවත්ය.

ඒ අනුව ඉදිරියේදී මෙම නම් ලැයිස්තුව එළියට ඒමට නියමිත බවද දැනගන්නට ඇත.

## රනිල් විජයදාස...

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වැඩබලන සභාපති ධූරය භාරගැනීමෙන් පසු අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතා සහ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා අතර විශේෂ හමුවක් පැවැත්වී ඇත.

විජයදාස රාජපක්ෂ මහතා විසින් කරනු ලැබ තිබූ ඉල්ලීමකට අනුව මෙම හමුව පැවැත්වී ඇති බව වාර්තා වේ.

මෙහිදී ඉදිරි ජනාධිපතිවරණයට ඉදිරිපත් වීම සම්බන්ධයෙන්ද දෙදෙනා අතර අදහස් හුවමාරු වී ඇති බව දැනගන්නට ඇත.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු 'රාජ්‍ය රහස්' තීරයේ පළවේ.

## ධම්මික පෙරේරා...

ඉදිරි ජනාධිපතිවරණයේ අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වීමට සූදානම් වන ලෙසට වූ දැනුම් දීම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ (පොහොට්ටුව) විසින් කෝටිපති ව්‍යාපාරික ධම්මික පෙරේරා මහතා වෙත සිදුකොට ඇති බව වාර්තා වේ.

ඒ අනුව, ධම්මික පෙරේරා මහතා මේ දිනවල ඊට අදාළ කටයුතු වෙනුවෙන් ළඟි ළඟියේ සූදානම් වන ආකාරයක් දැනගන්නට තිබේ.

ඉදිරි දින කිහිපය ඇතුළත පොහොට්ටුව විසින් එය නිල වශයෙන් ප්‍රකාශයට පත්කිරීමට සැලසුම් කරමින් සිටින බවක්ද දැනගන්නට ඇත.

## කෝටි 32ක්...

ආණ්ඩුවේ විමධ්‍යගත අරමුදලෙන් ව්‍යාපෘති සිදුකිරීම සඳහා ජනාධිපතිවරයා විසින් විපක්ෂයේ මන්ත්‍රීවරුන් 6 දෙනකුට රුපියල් කෝටි 32කට අධික මුදලක් වෙන්කොට ඇති බව මේ වන විට අනාවරණ වී තිබේ.

විපක්ෂයේ මෙම මන්ත්‍රීවරුන් 6 දෙනා හට කෝටි 5 සිට 10 දක්වා වූ මුදලක් මෙසේ ජනාධිපතිවරයා විසින් වෙන්කොට ඇති බව දැනගන්නට තිබේ.

මේ සම්බන්ධයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරුන් විපක්ෂ නායකවරයාටත්, සජබ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාරටත් පැමිණිලි කරමින් දැනුම් දී ඇත්තේ ජනාධිපතිවරයා සහ ආණ්ඩුව සමග සමීපව ගනුදෙනු කරන විපක්ෂ මන්ත්‍රීවරුන් හට පමණක් මෙසේ මුදල් වෙන්කිරීමට ජනාධිපතිවරයා පියවර ගෙන ඇති බවකි.

මෙය සම්පූර්ණයෙන් අසාධාරණ බවත්, පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අරමුදලෙන් සාධාරණව ප්‍රතිපාදන ලැබිය යුතු බවත් මන්ත්‍රීවරුන් එහිදී පෙන්වා දී ඇත.

ඒ අනුව, සජබ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාර මහතා මාධ්‍ය වෙත විශේෂ ප්‍රකාශයක් සිදුකරමින් කියා ඇත්තේ මෙසේ ජනාධිපතිවරයා මුදල් වෙන්කර ඇති මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන් ඉතා ඉක්මනින්ම තීන්දුවක් ගන්නා බවකි.

## සජබ සන්ධානය...

විපක්ෂයේ ප්‍රධාන පක්ෂය වන සමගි ජන බලවේගය විසින් ගොඩනැගීමට නියමිත දැවැන්ත සන්ධානය කඩාකප්පල් කිරීම සඳහා විපක්ෂයේම සිටින මන්ත්‍රීවරුන් කිහිප දෙනකු හට ආණ්ඩුව පැත්තෙන් විශාල කොන්ත්‍රාත්තුවක් ලබාදී ඇති බව දැනගන්නට තිබේ.

ඒ අනුව, මෙම මන්ත්‍රීවරුන්ට පැවරී ඇත්තේ එම සන්ධානයට එකතු වන මන්ත්‍රීවරුන්ට දූෂණ චෝදනා එල්ල කරමින් පහර දීමට සහ ඔවුන් සන්ධානයට එක්වන වැඩපිළිවෙළ අධෛර්යමත් වන ආකාරයට කටයුතු කිරීමය.

ඒ අනුව දැනටමත් මෙම මන්ත්‍රීවරුන් සජබ සන්ධානයට එක්වීමට සූදානමින් සිටින මන්ත්‍රීවරුන්ට පෞද්ගලිකවම චෝදනා එල්ල කරන තත්ත්වයට පත්ව ඇති බවක්ද දැනගන්නට තිබේ.

## කඩේ කුණු කෑම....

වමනය, බඩඑළිය යෑම, උණ රෝගය වැලඳී සතියකට වඩා ගතවී ඇති රෝගීන් සිටී නම් රෝහල්ගතව ප්‍රතිකාර ලබාගන්නා ලෙස ඔහු මවුපියන් දැනුවත් කර සිටී.

එවැනි අපිරිසිදු ස්ථානවලින් ආහාර මිලදී ගැනීමෙන් වළකින ලෙසත්, ඒ පිළිබඳ ළමුන් දැනුවත් කරන ලෙසත් ඔහු දැනුම් දී ඇත.

එවැනි රෝග ලක්ෂණවලින් පෙළෙන රෝගීන්ට බැදිහාල් කැඳ, දෙහි, දොඩම් වැනි දියර ආහාර ලබාදෙන ලෙසද වෛද්‍යවරයා මහජනතාව දැනුවත් කර ඇත.

මේ දිනවල පවතින මඳ වැසි සහිත කාලගුණික තත්ත්වය මත මැසි උවදුර වැඩිවී ඇති බවද සඳහන්ය.

## ගිය අවුරුද්දේ...

එය පෙර වසරට සාපේක්ෂව බලන විට 3,09,849ක වැඩිවීමක් බවත්, එය 27%ක ප්‍රතිශතයක් බවත් ඔහු පෙන්වා දුන්නේය.

ඒ අනුව මාසයකදී සාමාන්‍යයෙන් පුද්ගලයන් 1,18,900ක් පමණ රටින් පිටවී ගොස් ඇති බවයි සඳහන් වන්නේ.

මේ අයගෙන් 2,97,656ක් පමණ රටින් පිටව ගොස් ඇත්තේ විදේශ රැකියා සඳහා බවද සඳහන්ය.

2023 වසරේ විදේශ රැකියා සඳහා ගිය අයගෙන් 70%ක් පමණ විවිධ ආකාරයේ වෘත්තීය දක්ෂතා සහිත අය බවත්, අඩු දක්ෂතා සහිත අය 30%ක් පමණ වන බවත් අදාළ සංඛ්‍යාලේඛන හෙළිදරව් කොට ඇත. රටින් පිටව ගොස් ඇති අයගෙන් 55%ක් පිරිමින් වන අතර 45%ක් කාන්තාවන් බවද සඳහන්ය.

## ගංවතුරක් එනවා...

නිරිතදිග මෝසම් කාලගුණික තත්ත්වය ලබන මැයි 10 පමණ වන විට සක්‍රිය වීමත් සමග නිරිතදිග ප්‍රදේශවලට ගංවතුර සහ නායයෑමේ අවදානමක් ඇතිවීමට ඉඩ ඇති බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අතුල කරුණානායක මහතා 'මව්රට'ට පැවැසීය.

මේ දිනවල පවතින උණුසුම් කාලගුණ තත්ත්වය මත දිවයිනේ ඇතැම් පළාත්වලට රාත්‍රී කාලයේ ගිගුරුම් සහිත වැසි ස්වල්පයක් ඇදහැලුණද මැයි මස 10 වැනිදායින් පසු එම තත්ත්වය පහව යන බවයි ඔහු සඳහන් කළේ.

රාත්‍රී කාලයේ ඇතිවන අකුණු සර සහ මඳ වැසි සහිත කාලගුණ තත්ත්වය බස්නාහිර, ඌව, දකුණ, වයඹ, සබරගමුව යන පළාත්වලට බලපාන බවත් ඔහු සඳහන් කළේය.

වෙනත් වසරවලට වඩා මෙම වසරේ උණුසුම් කාලගුණ තත්ත්වයක් බලපෑ බවද ඔහු පැවැසීය.

## මැයි රැලිවලට...

ජාත්‍යන්තර කම්කරු දිනය නිමිත්තෙන් ලබන මැයි 01 වැනිදා කොළඹදී පැවැත්වීමට නියමිත මැයි රැලි සහ පෙළපාළිවලට පැමිණෙන ජනතාවගේ ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීන් 4,000ක් පමණ යෙදවීමට සැලසුම් කරගෙන යන බව කොළඹ ප්‍රදේශය භාර නියෝජ්‍ය පොලිස්පති චන්ද්‍රකුමාර මහතා 'මව්රට'ට පැවැසීය.

මෙවර කොළඹදී මැයි රැලි 13ක් සහ ප්‍රධාන රැලි 06ක් පවැත්වීමට පොලිසියෙන් අවසර ඉල්ලා ඇති අතර, මැයි දිනය ළං වන විට ලැබෙන බුද්ධි තොරතුරු පදනම් කරගෙන අවශ්‍ය වුවහොත් පමණක් ආරක්ෂාව සඳහා යුද හමුදාව යෙදවීමට සූදානමේ තබා ඇති බවද නියෝජ්‍ය පොලිස්පතිවරයා සඳහන් කළේය.

මෙවර පසුගිය වසරට වඩා විශාල පිරිසක් කොළඹට පැමිණෙතැයි බලාපොරොත්තු වන බවද පොලිසිය පැවැසීය.

කොළඹ ආරක්ෂාවට යොදවන පොලිස් නිලධාරීන් සමගම රථ වාහන හැසිරවීමේ පොලිස් කණ්ඩායම් ගණනාවක්ද සේවයේ යොදවනු ඇත.

රථ වාහන හැසිරවීමේ යෙදී සිටින පොලිසියට මාර්ග අවහිරතාවකින් තොරව රාජකාරි කිරීමට සහාය වන ලෙස මැයි රැලි සංවිධානය කරන පිරිස් අවස්ථා තුනකදී කොළඹට ගෙන්වා සාකච්ඡා කළ බවද නියෝජ්‍ය පොලිස්පතිවරයා පැවැසීය.

මේ අතර ලංකා පෞද්ගලික බස් රථ හිමියන්ගේ සංගමයේ සභාපති ගැමුණු විජේරත්න මහතා සඳහන් කළේ ඕනෑම දේශපාලන පක්ෂයකට හෝ සංවිධානයකට මුදල් ගෙවා පෞද්ගලික බස් රථ ලබාගත හැකි බවයි.

## ඇල්විටිගල බක්මහ උළෙල අප්‍රේල් 27 දවස පුරා...

අලුත් අවුරුදු ජන ක්‍රීඩා රාශියකින් සමන්විත 2024 ඇල්විටිගල බක්මහ උළෙල අප්‍රේල් මස 27 වැනිදා උදෑසන 7 සිට ඇල්විටිගල ක්‍රීඩාංගණයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

ඇල්විටිගල නිවාසවාසීන් සංවිධාන කරනු ලබන මෙම බක්මහ උළෙල අවසානයේ සංගීත ප්‍රසංගයක්ද පැවැත්වෙන අතර, ඇල්විටිගල නිවාස සංකීර්ණයේ සියලු දෙනාට මේ සඳහා පැමිණෙන ලෙස සංවිධායක මණ්ඩලය ඇරයුම් කර සිටී.

## දවස් 4ට 4000ක් හමුදාවෙන් අයින් වෙන්න ඇවිත් සමහරු පිටරටවල

**ප්‍රේමලාල් විජේරත්න**

ත්‍රිවිධ හමුදාවෙන් පලාගිය හමුදා සාමාජිකයන්ට භාරවීම සඳහා පසුගිය 20 වැනිදායින් ආරම්භ වූ පොදු සමා කාලය තුළදී දින හතරක් ඇතුළත යුද හමුදා සාමාජිකයන් 3,979ක් ඔවුන් සේවය කරමින් සිටි රෙජිමේන්තු කඳවුරුවලට භාරවී ඇතැයි හමුදා මාධ්‍ය ප්‍රකාශක මේජර් ජෙනරල් රසික කුමාර මහතා 'මව්රට'ට පැවැසීය. මෙය යුද හමුදාවෙන් පමණක් භාරවූ සංඛ්‍යාවය.

එසේ භාරවූ පිරිස් අතරින් හමුදා සාමාජිකයන් 05 දෙනකු විදේශ රටක සිට ඒ සඳහා කටයුතු සැලසුම් කර තිබූ අන්දමට ඉල්ලා අස්වීම භාරදී ඇති බවද ඔහු සඳහන් කළේය.

පොදු සමා කාලය තුළදී භාරවන හමුදා සාමාජිකයන් සියලු දෙනා වෛද්‍ය පරීක්ෂණවලට භාජනය කර ඔවුන්ගෙන් අයවිය යුතු මුදලක් වේ නම් ඒ පිළිබඳ තීරණ ගැනීම සඳහා දින 03ක මූලික පරීක්ෂණයක් සිදුකර අස්වීම් භාරගන්නා බවද ඔහු පැවැසීය.



# පාලිත ගියා

## ජීප් එක කොට උඩ

## නෝනා කතා කරයි...





**හදිසි අනතුරකින් පසුගියදා අභාවප්‍රාප්ත වූ හිටපු නියෝජ්‍ය අමාත්‍ය පාලිත තෙවරප්පෙරුම මහතා ගැන තොරතුරු ඔබ ඕනෑ තරම් මේ වන විට අසා දැක ඇතුවාට සැක නැත. ඔහු කළ සමාජ සේවාවන්, ඔහු සතු වූ මානුෂික ගුණාංග, අව්‍යාජ බව, ඔහුගේ වත්කම්, පවුලේ විස්තර ආදි තොරතුරු රාශියක් ඔබ දැනටමත් දන්නවා ඇත. එහෙත් ඔහු සිය දේශපාලන කටයුතුවලට, සමාජ සේවා කටයුතුවලට සහ සියලු පෞද්ගලික ගමන් බිමන්වලට යොදාගත් පැජරෝ වර්ගයේ ජීප් රථය ගැන ඔබ මෙතෙක් අසා නැතුවා වන්නට පුළුවන. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, මැති ඇමැතිවරුන් බහුතරයක් දෙනා ලෑන්ඩ් ක්‍රෑසර්, මොන්ටේරෝ, රේන්ජ් රෝවර් ආදි කෝටි ගණන් වටිනා සුපිරි ජීප් රථවල නැගී ගමන් බිමන් යද්දී තෙවරප්පෙරුම මහතා නියෝජ්‍ය ඇමැතිවරයකුව සිටියදී පවා භාවිත කළේ වසර 30කට වඩා පැරැණි මෙම මිට්සුබිෂි පැජරෝ ජීප් රථයයි. ඔහු සමග ජීවිතයේ වැඩි කාලයක් දුක සැප බෙදාගත් එතුමාගේ ආදරණීය බිරිය, තෙවරප්පෙරුම මහතා සහ එම ජීප් රථය හා බැඳුණු සංවේදී මතකයන් ආවර්ජනය කරමින් කළ සම්මුඛ සාකච්ඡාවක් Saana show යූටියුබ් නාලිකාව විසින් පසුගියදා ඉදිරිපත් කොට තිබිණි. පහත පළවන්නේ එම සාකච්ඡාවයි.**

**පාලිත තෙවරප්පෙරුම මහත්මයා භාවිත කරපු වාහනය ගැන අපිට විස්තර ටිකක් කියන්න පුළුවන්ද?**

තෙවරප්පෙරුම පරම්පරාවටම වාහනේකට තියෙන්නේ මෙච්චරයි. මේක ගත්තේ පාලිත අයියා රබර් කොන්ත්‍රාත් එකක් කරලා, රබර් ගස් ගලවලා, කරේ තියාගෙන අරගෙන ගිහිල්ලා මෝලට පටවලා දුක් විඳලා ගත්ත සල්ලිවලින් තමයි මේ වාහනේ ගත්තේ. පාලිත අයියගේ වාසනාවන්ත වාහනේ මේක. 2002 ඉඳලා හැම ඡන්දෙකින්ම පළමුවැනියා වුණා.

මේ වාහනේ මඟුල් තුලාවලට මිනිස්සුන්ට දුන්නා, මිනී ඇද්දා, ලෙඩ්ඩු ඇද්දා. කොරෝනා කාලේ නම් තනිකරම මේ වාහනේ තමයි ඒ වැඩවලට දිව්වේ. ගංවතුර කාලෙත් මිනිස්සුන්ට උදව් කරන්න යොදාගත්තේ මේ වාහනේ. අපි කොහේ හරි ගමනක් යද්දී පාරේ අනතුරක් දැක්කොත් පාලිත අයියා අපිව බස්සලා ඒ ලෙඩ්ඩුන්ව වාහනේට දාගෙන ඉස්පිරිතාලෙට අරගෙන යනවා.

> **මේ වාහනේ දැන් කොටඋඩ තියෙන්නේ දුවලා දුවලම කැඩිලා. පොම්පේ හිල්වෙලා, බ්‍රේක් පෑඩ් දාන්නත් ඕනේ. හැබැයි පාලිත හිටියා නම් මේක තල්ලුකරගෙන හරි ගිහින් හදාගන්නවා.**

**තෙවරප්පෙරුම මහත්තයා මේ වාහනේට ඩීසල් පුරවලා ජනතා සේවයට දුන්නා කියලා අපි දන්නවා. ඒ දවස්වල ඔබතුමිය කොහොමද ගමන් බිමන් ගියේ?**

අපි ගියේ ත්‍රීවීල්වල. එහෙම නැත්නම් අඳුරන ළමයෙක්ගේ වාහනයක.

**අද කාලේ මන්ත්‍රීවරුන්ට, ඇමැතිවරුන්ට තියෙන්නේ සුපිරි වාහන. තෙවරප්පෙරුම මහත්මයා ප්‍රාදේශීය සභාව, පළාත් සභාව නියෝජනය කළා. පාර්ලිමේන්තුව තුන් පාරක් නියෝජනය කළා. එහෙම කෙනෙකුට මීට වඩා හොඳ වාහනයක් තියෙන්න ඕනේ නේද?**

මෙහෙම එකක් තිබුණු එක හොඳයි කියලා හිතනවා. මළගෙදරට ආපු සෙනඟ අපි දැක්කා. පුතාලා දෙන්නයි මායි තමයි හිටියේ. අපි කවදාවත් සුඛෝපභෝගී ජීවිතයකට හැඩගැහුණේ නෑ. අපි ඒවා ඉල්ලුවෙත් නෑ. මහජනතාවට සේවය කරන්න එයාට ඉඩ දීලා අපි පැත්තකට වෙලා හිටියා. ගමනක් ගිහින් මොකක් හරි ඇක්සිඩන්ට් එකක් වෙලා තිබුණාම 'ෂෙරී බහින්න ෂෙරී බහින්න' කියනවා. අපි බැහැලා පාරේ අතරමං වෙනවා. පාරේ යන කෙනෙක් තමයි අපිව ගෙදරට ගෙනල්ලා දාන්නේ. මේක පෞද්ගලික වාහනයක් නෙවෙයි පොදු වාහනයක්. මිනිස්සුන්ගේ වාහනයක්. මෙතැන ඉඳලා වත්තට යන ටිකට දෙමළ, සිංහල, මුස්ලිම් මිනිස්සු කොච්චර ජීප් එකේ දාගෙන යනවද? ජාති ආගම් භේදයක් නෑ. අපි කවදාවත් මේක අපි සතු කරගන්න හිතුවේ නෑ. පුතාලා දෙන්නා හිටියට කවදාවත් මේ වාහනේ පදවලා නෑ.

**අපේ රටේ මැති ඇමැතිවරුන්ගේ බිරින්දෑවරුන්ට ලොකු ලොකු වාහන තියෙනවා. ඒ අය විවිධ රටවල සාප්පු සවාරි යනවා ජනතාවගේ සල්ලිවලින්. ඔබතුමියට කවදාවත් එහෙම හිතිලා නැද්ද?**

කවදාවත් නෑ. මමවත්, පුතාලා දෙන්නවත් එයාගෙන් ඒ වගේ දේවල් බලාපොරොත්තු වෙලා නෑ. අපි ඒවට කැමැතිත් නෑ. අහිංසක මිනිස්සුන්ගේ දේවලින් යැපෙන්න අපි කැමැති නෑ. තෙවරප්පෙරුම මහත්තයා පාර්ලිමේන්තුවේ හිටියා අවුරුදු 10ක්. ඒ අවුරුදු 10ටම අපි වාර දෙකකට වඩා පාර්ලිමේන්තුවට ගිහින් නෑ.

මේ වාහනේ දැන් කොටඋඩ තියෙන්නේ දුවලා දුවලම කැඩිලා. පොම්පේ හිල්වෙලා, බ්‍රේක් පෑඩ් දාන්නත් ඕනේ. හැබැයි පාලිත හිටියා නම් මේක තල්ලුකරගෙන හරි ගිහින් හදාගන්නවා.

**මේ ජීප් එක විකුණන්න අදහසක් නැද්ද?**

නෑ. මොනම හේතුවක් නිසාවත් විකුණන්නේ නෑ. මේකෙන් තමයි සියලු ජයග්‍රහණයන් එයා ලැබුවේ. වාහනේ පුතාගේ නමට හරවලා තියෙන්නේ.

**වාහනේ පොත තියලා සල්ලි අරගෙන කොරෝනා දවස්වල මිනිස්සුන්ට කන්න දුන්නා කියලා අපි අහලා තියෙනවා?**

ඒ කතාව ඇත්ත. අන්තිමට ඉඩමක් විකුණලා තමයි වාහනේ බේරගත්තේ. පාලිත ගංවතුර කාලේ හාල් මිටි ගණන් බෝට්ටුවලින් අරගෙන ගිහින් මිනිස්සුන්ට බෙදුවා. පුතාලා දෙන්නත් ඒ වැඩවලට උදව් කළා. පාලිතට ඕනේ වුණේ දරුවන් ගැන හොයනවටත් වඩා මිනිස්සුන්ට උදව් කරන්නයි. ලොකු පුතා නැතිවුණාට පස්සේ පොඩි පුතා ටික කාලයක් හිටියා. ඊට පස්සේ එයත් ගෙයක් හදාගෙන ඒ ගෙදරට ගියා. අපි මේ ගෙදර දොරවල් ජනෙල් කවදාවත් වැහුවෙ නෑ. මහත්තයා වහන්න දෙන්නෙත් නෑ. අද ඒ දේවල් මතක්වෙද්දී හරි සතුටුයි.

---

# නොදන්නා නොකියාම මව් කුසට පැමිණි

# දරුවාද අම්මාද කියනවාද වැරදී

## වයස දහතුනයි

## ලිංගික ප්‍රවේශයක් නෑ

## කන්‍යාභාවය සහතිකයි

## ඒත් ඇ ගැබිනියක්

**අම්මෙක් වෙනවා කියන්නෙ ලස්සන හීනයක්. හැබැයි ඒ හරි වෙලාවට හරි දවසට හරි විදියට වෙනවා නම් විතරයි. ලෝකෙ එක එක සංස්කෘතීන් ඇතුළෙ විවිධ නියමයන් හදාගෙන හිටියට අපි එහෙම නෑ. අපි කෙළින්ම නිගමනය කරන්න පුරුදු වෙලා ඉන්නෙ**

අම්මා කෙනෙක් වෙන්න නම් කසාද බඳින්න ඕනෙ. විවාහයක් නැතිව දරුවෙක් ලැබෙන එක ලංකාව වගේ රටක බරපතළ ප්‍රශ්නයක්. ඒක වුණේ කොහොමද කියලා හොයන්න තරම් විවෘත නොවෙන අපි ඒ ඒ අයට ඇඟිල්ල දික් කරන්න කලබලයි.

මේ සිදුවීම ඉතාම භයානක ඇත්තක්. සමහර විට ඔබ ඒ ගැන දන්නවා ඇති. ඒ අවුරුදු දහතුනක දැරිවියකට හදිසි උදරාබාධයක් හැදීමත් එක්ක පටන් ගන්න කතාව. ඇ පුංචි දැරියක්. මාපිය ආදරයත් එක්ක ඒ හැදෙමින් උන්නෙ. කවුරුවත් ඇ ගැන කියන්න වරදක් දැන නොඋන් බවයි අහන අහන අය කියන්නෙ. ඒක මහ පුදුම දෙයක් නෙමෙයි. අවුරුදු දහ තුනක් වුණු පුංචි දරුවෙක් නරක වෙන්න බෑ. එහෙම වෙන තැන් නෑ නෙමෙයි. ඒත් එහෙම වෙලා බෑ.

මේ දරුවගෙ කතාව ඉතාම සංවේදී වෙන්නෙ ඇගේ බඩේ අමාරුවට බෙහෙත් ගන්න ගිය තැනදි. ඇගේ බඩේ අමාරුව සම්බන්ධව පරීක්ෂණ කීපයක්ම කරනවා. ඒවායෙ ප්‍රතිඵල ඉතාම ගැටලුකාරී නිසාම නැවත නැවත පරීක්ෂණ කරනවා. අවසානයේ ඒ පරීක්ෂණ ප්‍රතිඵලය පිළිගන්න සිද්ධ වෙනවා. අකැමැත්තෙන් වුණත් අවසානයේ ඒ ප්‍රතිඵලය ඉදිරිපත් කරනවා.



ජීවන පහන් තිළිණ

'එයාට දරුවෙක් ලැබෙන්න ඉන්නවා' කියලා. වෙන වෙලාවක නම් උඩ පැනලා නටන්න හිතෙන සතුටක් වුණත් මේ වෙලාවෙ ඒක ඇඟ කිලිපොළා යන තරමෙ භයානක ආරංචියක් වෙනවා.

'ඒක එහෙම වෙන්න බෑ' කියලා ඒ දරුවා කෑ ගහලා ඇඬුවා කියලා ඒ ඇඬුමෙ හඬ අහන්න දෙයියෙක් හිටියෙ නෑ. පිහිටක් වෙන්න කෙනෙක් හිටියෙත් නෑ.

'කොහොම ද එහෙම උනේ?' කියලා එක එක විදියට ඇහුව අම්මට තාත්තට උත්තරයක් දෙන්න වෙන කෙනෙක් හිටියෙත් නෑ. මේ වෙලාවෙත් නෑ. ගහලා බැණලා ඇහුවත් දෙන්න උත්තරයක් තිබ්බෙ නෑ.

'හරි අපි විද්‍යාවෙන් බලමු' කියලා මේ වෙලාවෙ දොස්තර මහත්තුරු ඇගේ කන්‍යාභාවය පිළිබඳ පරීක්ෂණයක් කරනවා. ඒ හරහා තමයි ලිංගික ප්‍රවේශයක් වෙලා තියෙනවද කියන එක දැනගන්න පුළුවන් වෙන්නෙ. බොහෝ විට මේ කාරණාව හංගන්න බෑ. කන්‍යාභාවය නොපිහිටීම ස්වභාවික වුණත් ලිංගික ප්‍රවේශයකදී කන්‍යාභාවයට හානි නොවීම ඉතාම අස්වාභාවිකයි.

ඒත් ඇ ඒ පරීක්ෂණයෙන් සමත් වෙනවා.

'ඇ කන්‍යාභාවය සහිතයි'

මේ උත්තරය හරිද වැරදිද කියන එකට එකම එක උත්තරය තිබුණෙ මරිය මව්තුමිය ගාව. මරිය මව්ගේ කතාව විතරද මේ විදියට සාක්ෂියක් වුණේ කියලා හොයන්න සිද්ධ වුණා.

'අනේ එයා එහෙම ළමයෙක් නෙමේ, එහෙම දෙයක් තියා ඒ දරුවට සම්බන්ධයක්වත් තිබිලා නෑ' කියන කතාවත්, ඒ දරුවා දිගින් දිගටම කියපු කාරණාත් එක්ක මේ වෙලාවෙ ඔප්පු කරන්න ලෝකයෙන් සාක්ෂි හොයන්න සිද්ධවුණා. මෙන්න මේ වෙලාවෙ තමයි හොයාගන්නෙ ජෝන් හොප්කින්ස් සරසවියේ පරීක්ෂණයක් ගැන. ඔවුන් සිංගප්පූරුවෙ රෝහල් ආශ්‍රිතව කරපු පරීක්ෂණයක් හරහා ඔප්පු කරගත්තා මේ කාරණාවම. ඔවුන් කියනවා 'කන්‍යා ගැබ් ගැනීම' සිදුවිය හැකි බව. මේ පරීක්ෂණය ඔස්සේ තහවුරු වෙන්නෙ මේක ඉතාම විශාල අහඹුවක් නොවන බව. කාන්තාවන් හත්දහස් අටසිය හැත්තෑවකින් හතළිස් පස් දෙනෙක් මෙවැනි ගැබ්ගැනීම් සහිත බව ඔවුන් ඔප්පු කරනලා පෙන්වනවා. ඒ විදියට ගැබ් ගැනීමක් සිදුවීමේ සම්භාවිතාව 0.8%ක් බවයි විද්‍යාත්මකව ඔප්පු වෙලා තියෙන්නෙ.

මේ වෙලාවෙ අන්තර්ජාලයෙ ලිපි සහ සමහර පරීක්ෂණ වාර්තාවලට අනුව ශුක්‍රාණුවක් දින පහක් දක්වා සජීව තත්ත්වයෙ පවතින බවක් සඳහන් වෙනවා. ඒ පරීක්ෂණ තත්ත්වයේ හෝ ශීතකරණ ලද ශුක්‍රාණුවක් නෙමෙයි. එහෙමනම් මේ කාලය ඉතාම වැඩියි. මේ විදියෙ ජීව ශුක්‍රාණුවක් කාන්තා හර්භාෂයකට, ගැබ් ගැනීමකට සූදානම් අවස්ථාවක ඇතුළු වුණොත් මේ විදියෙ ගැබ්ගැනීමක් වෙන්න පුළුවන් බව කියනවා. සාමාන්‍ය ගමේ ගොඩේ ආච්චි අම්මලා දරුවන්ට 'පිරිමින්ගෙ සරං අඳින්න එපා' වගේ දේවල් කියන්නෙ මෙන්න මේ නිසා. ඒ නිසා අවසන් නිගමනය වෙන්නෙ මේ ගැබ් ගැනීම ඒ විදියෙ ආගන්තුක ශුක්‍රාණුවක් අනාරාධිතව පදිංචි වීමක ප්‍රතිඵලයක් බව. ඒත් ඒ හරහා මේ දරුවගෙ ජීවිතයට සහ ඒ දරුවගෙ කුසෙන් බිහිවෙන දරුවට සිද්ධ වෙන දේ මොකක්ද කියන එක ප්‍රශ්නයක්. ඒ වගේම මේ දරුවට තව දුරටත් පාසල් ශිෂ්‍යාවක් විදියට කටයුතු කළ හැකිද කියන එකත් ප්‍රශ්නයක්. ඉතින් මේ ගැටලු සියල්ල විශේෂ තත්ත්වයක් යටතේ සලකා බලන ලෙස අපිට සියලු පාර්ශ්වවලින් ඉල්ලා සිටින්න වෙනවා.

මේ වෙලාවෙ 'මේ දරුවා වැරදි නෑ' කියන එක ප්‍රසිද්ධියෙම කියන සියලු පාර්ශ්වවලට අපි අපේ ආචාරය පුදකරනවා. නමුත් මෙන්න මේ වෙලාවෙ අපිට ආයෙත් ගබ්සාව කියන මාතෘකාව කතා කරන්න පටන් ගන්න වෙනවා.

> **අන්තර්ජාලයෙ ලිපි සහ සමහර පරීක්ෂණ වාර්තාවලට අනුව ශුක්‍රාණුවක් දින පහක් දක්වා සජීව තත්ත්වයේ පවතින බවක් සඳහන් වෙනවා. ඒ පරීක්ෂණ තත්ත්වයේ හෝ ශීතකරණ ලද ශුක්‍රාණුවක් නෙමෙයි. එහෙමනම් මේ කාලය ඉතාම වැඩියි. මේ විදියෙ ජීව ශුක්‍රාණුවක් කාන්තා හර්භාෂයකට, ගැබ් ගැනීමකට සූදානම් අවස්ථාවක ඇතුළු වුණොත් මේ විදියෙ ගැබ්ගැනීමක් වෙන්න පුළුවන් බව කියනවා. සාමාන්‍ය ගමේ ගොඩේ ආච්චි අම්මලා දරුවන්ට 'පිරිමින්ගෙ සරං අඳින්න එපා' වගේ දේවල් කියන්නෙ මෙන්න මේ නිසා. ඒ නිසා අවසන් නිගමනය වෙන්නෙ මේ ගැබ් ගැනීම ඒ විදියෙ ආගන්තුක ශුක්‍රාණුවක් අනාරාධිතව පදිංචි වීමක ප්‍රතිඵලයක් බව.**



මව්රට

ලිපිනය
නො: 22, ජයරත්න මාවත,
කොළඹ 05

කර්තෘ මණ්ඩලය
0112505134
0114349982

ඊමේල්
news@mawratanews.lk

වෙබ් අඩවිය
www.mawratanews.lk

බෙදාහැරීම්
0764 449 688

දැන්වීම්
0114349983

උපුල් ජෝශප් ප්‍රනාන්දුගේ

## ගුරුදු විග්‍රහය



# අහසින් පොළොවට

2019 ජනාධිපතිවරණයට තරග කරන්න රනිල් ගණන් බල බලා සිටියදී යූ.ඇන්.පී.ය සජිත්ව ජනාධිපති අපේක්ෂකයා කළ යුතු බවට අරගලයක් කළේය. මේ අරගලය මධ්‍යයේ රනිල් ජ්‍යොතිෂ උපදේශකයන් කැඳවා ඔහුගේ හඳහන පරීක්ෂා කොට බැලුවේය. එක් ජ්‍යොතිෂවේදියෙක් ඔහුට අපූරු උපදෙසක් දුන්නේය.

'1993 සර්ට අගමැති වෙන්න ආපු ග්‍රහ යෝගය 2022 ආයේ එනවා. සජිත්ට ජනාධිපති අපේක්ෂකකම දීලා සර් අගමැති අපේක්ෂක වෙන්න. සජිත් දින්නත් සර් අගමැති වෙයි. පැරැදුණොත් සර් විපක්ෂ නායක වෙලා 2022 මොන ක්‍රමයකින් හරි ආපහු බලයට එයි...'

මේ, ඒ ජ්‍යොතිෂවේදියා දුන්න උපදෙසය. රනිල් මේ උපදෙස අරගෙන යූ.ඇන්.පී.ය ජනමත සමීක්ෂණ කරන ජනමත සමීක්ෂණ ආයතනයට කියා ජනාධිපතිවරණය ගැන අලුත් සමීක්ෂණයක් කරගත්තේය. ඒ සමීක්ෂණයට අනුව සජිත් හිටියේ ගෝඨාභයට පසුපසින්ය.

'මේ සර්වේ රිපෝට්වල හැටියට සජිත්ට දිනන්න බැහැ...'

රනිල් සිය සමීපතමයන්ට කීවේය. සජිත්ට ජනාධිපති අපේක්ෂකකම දෙන්න රනිල් තීරණය කළේ ඒ සර්වේ රිපෝට් බලලාය.

'සජිත් දින්නොත් ලොක්කා අගමැති. සජිත් පැරැදුණොත් ලොක්කා විපක්ෂ නායක...'

මේ, ඒ කාලේ රනිල්ගේ සමීපතමයන් මතුරපු මන්ත්‍රයය.

දැන් රනිල්ගේ සමීපතමයන් යළිත් ඒ මන්තරය මතුරන්න පටන්ගෙන තිබේ. සමගි ජන බලවේගයේ පක්ෂ ලේකම් රංජිත් මද්දුමබණ්ඩාර කියන විදියට සජිත්ව ජනාධිපති කර රනිල් අගමැති වෙන්න යෝජනාවක් සමගි ජන බලවේගයට එවා තිබේ.

'ඒ කියන්නේ රනිල් අහසින් පොළොවට වැටිලද?'

රනිල් ජනාධිපති වූ විගස රනිල්ගේ සගයෝ කිව්වේ 2023 මාර්තුවලට කලින් රනිල් හදිසි ජනාධිපතිවරණයක් කැඳවනවා කියාය. සමගි ජන බලවේගය ගෙඩිය පිටින් රනිල් ළඟට එන බවත්, රනිල් නිර්පාක්ෂික අපේක්ෂකයා ලෙස දිනන බවත් ඔවුහු කීහ.

ඉන් පසු රනිල් හදිසි මැතිවරණයක් කැඳවා සජිත් දින්නොත් සජිත්ට අගමැති ධුරය නොදී සමගි ජන බලවේගයේ වෙනත් අයෙක්ට අගමැති ධුරය දී සමගි ජන බලවේගය ගෙඩිය පිටින් ගෙන ජනාධිපතිවරණයට යනවා යැයි කියාය.

ඊටත් පසු 2023 නොවැම්බර් හදිසි ජනාධිපතිවරණයක් කැඳවා සමගි ජන බලවේගය දෙකට තුනට හතරට කඩා නව සන්ධානයකින් පොදු අපේක්ෂකයා වෙනවා යැයි කියාය.

### පොහොට්ටුවට වෙන්න යන දේ

අවසානයේදී කීවේ සජිත් අන්තිම මොහොතේ ජනාධිපතිවරණයට ඉල්ලන්නේ නැතිව රනිල්ට අපේක්ෂකකම දී සජිත් අගමැති වෙනවා කියාය.

2022 ජූලි සිට 2024 ජූලි මාසයට වසර දෙකකි. මේ එකක්වත් වූයේ නැත. දැන් වෙලා තියෙන්නේ රනිල් සජිත්ගෙන් අගමැති ධුරය ඉල්ලීමය. ඒ කියන්නේ වටයක් ගිහින් ඇවිත් තියෙන්නේ 2019 හිටපු තැනටමය.

'ඉතින් සජිත් මේ ඩීල් එකට කැමැති වෙයිද?'

සජිත් කැමැති වුණත් මේ ඩීල් එකට මහජනතාව කැමැති නැත. සජිත් කියන්නේ මේ රටේ තවම අගමැති හෝ ජනාධිපති හෝ මුදල් හෝ ආරක්ෂක වැනි ප්‍රබල ඇමැති ධුරයක්වත් දරපු නැති නායකයෙකි. ඔහු දැරුවේ 1994න් පසු පක්ෂයක තෙවැනි පෙළ නායකයන් දරන ඇමැතිකමක්ය. සජිත් වගේම ජවිපෙ නායක අනුරත් මේ රටේ තවම අගමැති හෝ ජනාධිපති හෝ මුදල් හෝ ආරක්ෂක වැනි ප්‍රබල ඇමැති ධුරයක් දරපු නැති නායකයෙකි. ඔහු 2004 කෘෂිකර්මාන්ත ඇමැති විය. අද ජනතාව ඉල්ලන්නේ ඒ වගේ අලුත් නායකයන්ය. සජිත් රනිල්ට අගමැතිකම දෙනවා කිව්වොත් ආයෙත් එන්නේ 2019ට කලින් තිබුණු යූ.ඇන්.පී.යමය. ඒ යූ.ඇන්.පී.ය මිනිස්සු පොළොවට සමතලා කරලා ගොඩක් කල්ය. සජිත් රනිල්ට අගමැතිකම දෙනවා කිව්වොත් එහි වාසිය ගන්නේ අනුර කුමාරය. සජිත්-රනිල් හවුල එන්නේ, පරණ යූ.ඇන්.පී.යට පණ දෙන්න කියා, උන් ඔක්කොම එකයි මල්ලි කියන්න අනුරට අවස්ථාව හිමිවෙයි.

'එතකොට ඇයි මේ සමගි ජන බලවේගයේ සමහරු කියන්නේ රනිල්-සජිත් එකතු වෙන්න ඕනා කියලා...'

රනිල්-සජිත් එකතු වෙන්න ඕනා කියලා සමගි ජන බලවේගයේ කතා කරන මන්ත්‍රීවරු රනිල්-මෛත්‍රී ආණ්ඩුවේ හිටපු ප්‍රබල ඇමැතිවරුය. ඔවුන් ඇමැතිකම් කරපු කාලයේ ඔවුන්ගේ දූෂණ අක්‍රමිකතා ෆයිල් තියෙන්නේ රනිල් අතේය. රනිල් ඒ ෆයිල් පෙන්නා ඔවුන්ව බයකරන විට ඔවුන් රනිල්-සජිත් එකතු විය යුතුය යන මන්ත්‍රය මතුරයි.

රනිල් ජනාධිපතිවරණයට ඉල්ලන්නේ නැතිව සජිත්ගේ අගමැති වෙන්න හදන්නේ 2019 වගේම තමා ඉල්ලුවොත් අන්ත පරාජයක් ලබන බව දැනගෙනය.

'එහෙම නම් රනිල් අගමැති ලෙස නම් කිරීමෙන් සජිත්ට ලැබෙන මැතිවරණ වාසිය කුමක්ද...?'

අවාසියක් මිස වාසියක් නැත.

'එහෙනම් රනිල්ව ජනාධිපති අපේක්ෂක කිරීමෙන් පොහොට්ටුවට ලැබෙන වාසිය කුමක්ද?'

පොහොට්ටුවටත් වාසි වන්නේ අලුත් මුහුණක් ජනාධිපතිවරණයට ගෙන ආවොත්ය.

රනිල් සමගි ජන බලවේගයේ පක්ෂ ලේකම්ට ගෙන ආ මේ යෝජනාව 2019 ජනාධිපති මෛත්‍රී පොහොට්ටුවට ගෙන ආවේය. මෛත්‍රීත් ඒ කාලයේ රඟපෑවේ මේ රනිල්ගේම චරිතයය. එදා මෛත්‍රී ළඟ හිටපු ප්‍රචාරක උපදේශකයන් අද ඉන්නේ රනිල්ව වටකරගෙනය. 2019ට කලින් පත්තර, ටී.වී. බැලුවා නම් තියෙන්නේ මේ වගේ නිවුස්ය.

'මෛත්‍රී රනිල්ව යූ.ඇන්.පී. නායකත්වයෙන් ඉවත් කොට සජිත් හෝ කරු අගමැති කොට යළිත් ජනාධිපති පොදු අපේක්ෂක වෙයි...'

'මෛත්‍රී යූ.ඇන්.පී.ය දෙකඩ කර මහින්ද පිලත් දෙකඩ කර ජනාධිපති සටනට...'

'අගමැති ධුරයෙන් රනිල් ඉවතට. අගමැති සජිත් හෝ කරු. යූ.ඇන්.පී. පොදු අපේක්ෂක මෛත්‍රීපාල...'

'මහින්දව අගමැති කොට මෛත්‍රී පොහොට්ටු - ශ්‍රීලනිප සන්ධානයෙන් ජනාධිපති අපේක්ෂක වෙන ලකුණු...'

'ගෝඨාව අගමැති අපේක්ෂක කොට මෛත්‍රී ජනාධිපති අපේක්ෂක වෙන හැඩ...'

ඒ කාලයේ හැමදාම පත්තරවල ටීවීවල පැලවුණේ මේ නිවුස්ය. මෛත්‍රී හිටි හැටියේ රනිල්ව අගමැති ධුරයෙන් ඉවත් කොට මහින්දව අගමැති කළේත් පොහොට්ටුවේ ජනාධිපති අපේක්ෂකකම බලාගෙනය. පසුව අද රනිල් වටේ ඉන්න එදා මෛත්‍රී වටේ හිටපු ප්‍රචාරක උපදේශකයන් 2019 පාස්කු බෝම්බයට පසු මෛත්‍රී ජනාධිපතිවරණයට එන කතාව හංගලා අලුත් කතාවක් හැදුවේය.

'ගෝඨා ජනාධිපති අපේක්ෂක - මෛත්‍රී අගමැති අපේක්ෂක'

මේ, ඔවුන් හදලා මාධ්‍යයට දුන්න අලුත්ම කතාවය. මේක කතාවක් පමණක් නොව ලණුවකි. මෛත්‍රී හොඳටම මේ ලණුව කෑවේය. ඔහු ශ්‍රීලනිපයට ගෝඨාභයට සහාය දෙන්න යන්න කිව්වේ මේ ලණුව කාලාය. මෛත්‍රී ගෝඨාට සහාය දෙන්න වේදිකාවට නගින්න එන විට පොහොට්ටුව එපා කීවේය.

'ඔබතුමා නිහඬව සහාය දෙන්න. වේදිකාවට ආවොත් අපිට අවාසි වෙයි...'

මේ, ඒ කාලයේ රාජපක්ෂ පවුලම එකතු වෙලා මෛත්‍රීට දුන්න දිරච්ච ලණුවය. සමගි ජන බලවේගය

### මෛත්‍රීපාල එදා කාපු ලණුව

නම් මේ වගේ දිරච්ච ලණුවක්වත් රනිල්ට දෙන්න බයයි වගේය. හේතුව රනිල්-සජිත් එකතු වෙනවා කියලා කිව්වම මිනිස්සු අහක බලයි කියන බයය.

ජනාධිපති ඡන්දයට තව තියෙන්නේ දවස් 190කි. දවස් 190ට සමගි ජන බලවේගය කඩලා ජනාධිපති වෙන්න ගිය රනිල් අගමැතිකම ඉල්ලන තැනට වැටුණා නම් තව දවස් 90කින් ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රීකමක් ඉල්ලන තැනට වැටෙයිද දන්නේත් නැත.

සජිත්ගෙන් අගමැති අපේක්ෂකකම ඉල්ලන රනිල්ව ජනාධිපති අපේක්ෂක කරන්න යන පොහොට්ටුවට නම් සොරි ඩොට් කොම්ය.

උපුල් ජෝශප් ප්‍රනාන්දු



# රුවන්මැලි සෑයේ ධාතු ගර්භය ඇතුළේ පිරිත් කියන්නේ කවුද?

- භාතිය රජු ධාතු ගර්භය ඇතුළට අරන් ගියේ කවුද?
- මේ ප්‍රතිමාව දැකලා තියෙන අය ඉන්නවාද?

**රුවන්මැලි මහා සෑය වන්දනා කරන්න යන කෙනෙකුට සලපතළ මළුවේ තිබෙන බුදු මැඳුර පසුකොට ඉදිරියට යන විට රුවන්මැලි මහා සෑයට වන්දනා කරගෙන සිටින රජ කෙනකුගේ ප්‍රතිමාවක් හමුවේ. ඒ, භාතිය රජතුමාගේ ප්‍රතිමාවයි.**

රුවන්මැලි මහා සෑයට ඉතාමත් ශ්‍රද්ධාවෙන් නොයෙකුත් පින්කම් සිදුකළ භාතිකාභය හෙවත් භාතිය රජතුමා හැම දවසක්ම උදෑසන ආහාර අනුභව කළේ රුවන්මැලි මහා සෑයට වන්දනා කිරීමෙන් පසුවයි. හවසටත් රුවන්මැලි මහා සෑයට වන්දනාමාන කිරීමෙන් පසුවයි ඔහු ආහාර අනුභව කළේ. දවසක් රජතුමාට යෙදිලා තිබුණු කටයුත්තක් නිසා හොඳටම හවස් වුණා. ඒ කටයුතු අවසන් කරලා රජතුමා කෙළින්ම මාලිගාවට ගිහින් ආහාර අනුභව කරන්න වාඩි වුණා. බත් පිඬ අතට ගන්නකොටම රජතුමාට මතක් වුණා අද මම රුවන්මැලි මහා සෑයට හවස්වරුවේ වන්දනා කළේ නැහැ නේද කියලා. රජතුමා බත් පිඬක් අතේ තියාගෙනම ළඟ සිටිය රාජ පුරුෂයන්ගෙන් මෙහෙම ඇහුවා. 'අද මම මගේ මුත්තණුවන්ට වන්දනා කළේ නැහැ නේද?' කියල. එදා භාතිය රජතුමා තමන්ගේ මුත්තණුවන් හැටියට ගෞරවයෙන් පිළිගත්තේ ද්‍රෝණයක් සර්වඥ ධාතූන් වහන්සේලා තැන්පත් මේ උතුම් දාගැබයි.

රාජ පුරුෂයෙක් රජතුමාට කියනවා, 'දේවයන් වහන්ස අද දාගැබ් වහන්සේ වන්දනා කළේ නැහැ' කියලා. රජතුමා කලබලයට පත්වෙලා තමන් අනුභව කරන්න ගත්ත බත් පිඬ ආපහු රන් තලියට දමා නැගිට්ටා. ඉක්මනින්ම මාලිගාවෙන් එළියට ඇවිත් රුවන්මැලි මහා සෑය වන්දනා කරන්න පිටත් වුණා. දකුණු වාසල් දොර විවෘත කරගෙන විහාරයට ඇතුළුවෙලා නැගෙනහිර දොරටුවෙන් චෛත්‍යය මළුවට ඇතුළු වුණා. භාතිය රජ්ජුරුවෝ ඉතාම ශ්‍රද්ධා ගෞරවයෙන් රුවන්මැලි මහා සෑය වන්දනා කළා. එදා රජතුමාට පුදුම සිදුවීමකට මුහුණ දෙන්න සිදුවුණා.

භාතිය රජතුමාට ඇහුණා කවුදෝ පිරිසක් බොහොම මිහිරි හඬින් පිරිත් සජ්ඣායනා කරනවා. මේ පිරිත් හඬ ඇහෙන්නේ කොයි පැත්තෙන්ද කියලා රජතුමා මළුව වටේ ඇවිදිමින් සොයා බැලුවා. නමුත් පිරිත් කියන කෙනෙක් දකින්න ලැබුණේ නැහැ. කිසිම භික්ෂූන් වහන්සේ නමක් පෙනෙන්න හිටියෙත් නැහැ. හොඳින් කන් යොමුකරගෙන සිටිද්දී මේ පිරිත් හඬ ඇහෙන්නේ චෛත්‍යයේ ධාතු ගර්භයේ ඇතුළතින් කියලා රජතුමාට වැටහුණා.

එදා භාතිය රජතුමා නැගෙනහිර වාහල් දොරටුව අසල නැවතිලා චෛත්‍යයට වන්දනා කරගෙන මෙවැනි අධිෂ්ඨානයක් කළා. 'චෛත්‍යයේ ධාතු ගර්භයෙහි පිරිත් සජ්ඣායනා කරන්නේ කවුද කියලා දැකගෙන මිසක් මම මෙතැනින් නැගිට්ටන්නෙ නැහැ. මම මේ ආකාරයේ ශ්‍රද්ධාවකින් උදේ හවස චෛත්‍යයට වන්දනා කරනවා. ඒ ගුණානුභාවයෙන් මට මේ සිදුවීම දැකගන්න ලැබේවා' කියලා රජතුමා අධිෂ්ඨානයක් කළා.

භාතිය රජතුමාගේ ගුණානුභාවයෙන් ශක්‍ර දෙවියන්ගේ ආසන උණුවෙන්න පටන් ගත්තා. ශක්‍ර දෙවියන් හිත යොමුකරලා බැලුවා මොකක්ද කාරණය කියලා. ඒ ගැන වටහගත් ශක්‍ර දෙවියන් තවුතිසා දෙව්ලොව සිට වැඩම කොට රුවන්මැලි මහා සෑයේ ධාතු ගර්භය තුළ පිරිත් සජ්ඣායනා කරමින් සිටි සෘද්ධිබල සම්පන්න මහරහතන් වහන්සේලාට ඒ බව දැනුම් දුන්නා. සෘද්ධිබල සම්පන්න මහරහතන් වහන්සේලා ධාතු ගර්භය තුළට වැඩම කොට පිරිත් සජ්ඣායනා කරනවා. ඒ පිරිත් හඬ තමයි රජතුමාට අහන්න ලැබුණේ.

පිරිත් සජ්ඣායනා කරමින් සිටි රහතන් වහන්සේලා අතරින් එක් රහතන් වහන්සේ නමක් තවත් සෘද්ධිබල සම්පන්න තෙරුන් වහන්සේ නමකට පැවරුවා චෛත්‍යය මළුවේ සිටින රජතුමාව ගෙනැවිත් ධාතු ගර්භය වන්දවන්න කියලා. ඒ රහතන් වහසේ සෘද්ධිබලයෙන් ධාතු ගර්භයෙන් එළියට ඇවිත් භාතිය රජතුමාගේ අතින් අල්ලගෙන රුවන්මැලි මහා සෑයේ ධාතු ගර්භය ඇතුළට එක්කගෙන ගියා. රජතුමාගේ හිතේ හැටියට ධාතු ගර්භය වන්දනා කරගන්න සැලසුවා. ආයෙමත් සලපතළ මළුවට ගෙනැවිත් ඇරලුවා.

සෘද්ධිබල සම්පන්න මහරහතන් වහන්සේ නමකට තමන්ගේ සෘද්ධිබලයෙන් තව කෙනෙක්ව අහසින් වුණත් අරගෙන යන්න පුළුවන්කම තියෙනවා. බුදුරජාණන් වහන්සේ නන්ද භික්ෂුවගෙ අතින් අල්ලගෙන දිව්‍ය ලෝකය පෙන්වපු සිදුවීම ඔබ අහලා ඇති. අන්න ඒ ආකාරයට තමයි සෘද්ධිබල සම්පන්න මහරහතන් වහසේ නමක් තම සෘද්ධි බලයෙන් භාතිය රජතුමන්ව අතින් අල්ලගෙන ධාතු ගර්භය වන්දනා කරවන්න ඇතුළට ගෙන ගියේ.

ධාතු ගර්භය තුළ සත් රුවනින් යුතුව නිමවා තිබෙන බුදුරජාණන් වහන්සේගේ ජීවිතය හා බැඳුණු බොහෝ සිදුවීම් රජතුමා නගරවාසීන්ටත් පෙන්නුවොත් හොඳයි කියලා කල්පනා කළා. ඒ අනුව රජතුමා තමන් දැකපු රූප රාජ මාලිගාවේ මිදුලේ මණ්ඩපයක් මත රන්කරුවන් ලවා ඉදිකළා. භාතිය රජතුමා වසරක් පාසාම නගරවාසීන්ට තමන් දුටු ඒ ධාතු ගර්භයෙහි සැලැස්ම ප්‍රදර්ශනය කරපු බවත්, එය දැක සතුටට පත්වූ නගරවාසීන් අතර සිටි බොහෝ කුල දරුවන් පැවිදි වූ බවත් ථූපවංශයෙහි සඳහන් වෙලා තියෙනවා.

ඉතිහාසයෙහි ප්‍රථම වතාවට රුවන්මැලි මහා සෑය තරම් විශාල චෛත්‍යයක් මල්වලින් පුරවලා මල් ඔටුන්නක් ලෙස සරසලා තිසාවැවෙන් ජලය ගෙනැවිත් යන්ත්‍රානුසාරයෙන් කොත් කැරැල්ල තෙක් වතුර මලක ආකාරයට ජලය විදිමින් සතියක් පුරා පූජාවන් පවත්වපු එකම රජතුමා භාතිකාභය රජතුමා පමණයි.

රජතුමා ඒ පූජාව වෙනුවෙන්ම රටේ බොහෝ ප්‍රදේශවල ඉද්ද, දෑසමන් ආදී මල් වර්ග වගා කෙරෙව්වා. දක්ෂ ශිල්පීන්ගේ දැනුම යොදාගෙන ජලය විදින යන්ත්‍රයක් සකස් කෙරෙව්වා. එකසිය විසි රියනක් උසින් යුතුව එදා දුටුගැමුණු රජතුමන් ඉදිකළ රුවන්මැලි මහා සෑය මළුවේ සිට කොත් කැරැල්ලක් දක්වා මල් පුරවලා ඔටුන්නක් ලෙස මල්වලින් වැසුවා. සතියක් පුරාම යන්ත්‍රානුසාරයෙන් ජලය ඉසිමින් චෛත්‍යයට අප්‍රමාණ ශ්‍රද්ධා ගෞරවයෙන් පූජාවන් සිදුකළා. එවැනි ශ්‍රද්ධාවන්ත රජ කෙනකුගේ ප්‍රතිමාවක් තමයි චෛත්‍යයෙහි සලපතළ මළුව තුළ ඔබට දකින්න ලැබෙන්නෙ.

එදා රජවරු රුවන්මැලි මහා සෑයට සිදුකළ ඒ පූජාවන් ගැන සිහි කරද්දී රුවන්මැලි මහා සෑයේ පූජනීයත්වය එදා රජවරු හොඳින්ම වටහාගෙන සිටි බව පැහැදිලි වෙනවා.

මහාවංසයෙහි සඳහන් වන ආකාරයට බොහෝ රජවරු අප්‍රමාණ ශ්‍රද්ධා ගෞරවයෙන් රුවන්මැලි මහා සෑයට පූජාවන් සිදුකොට තිබෙනවා. මහානාග නම් රජතුමා චෛත්‍යය වටා තිබුණු වැලි මළුව විශාල කරවලා තිවංක නම් ගල් වර්ගයක් මළුවේ අතුරා අලංකාරවත් ලෙස සකස් කළ බවත් සඳහන් වෙනවා.



උපුටා ගැනීම අන්තර්ජාලයෙනි





# කාදිනල් හිමිපාණන් ජාතියට කතා කරයි

## මේ කතාව හොඳට කියවන්න...

**පාස්කු ඉරුදින බේදවාචකයේ 5 වසරක සිහිකිරීම වෙනුවෙන් මීගමුව මාරිස්ටෙලා විදුහලේදී සැමරුම් මොහොතක් පැවැත්වූ අතර, එයින් අනතුරුව කටුවපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය දක්වා යාච්ඤාවේ පාගමනක් සිදුකෙරිණි. මෙම අවස්ථාවට කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ඇතුළු ගරු පූජ්‍යප්‍රසාදීතුමන්ලා සහ පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් ජනතාවගේ පවුල්වල ඥාතීහු සහභාගි වී සිටියහ. එම අවස්ථාවේදී රැස්ව සිටි පිරිස අමතමින් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විශේෂ ප්‍රකාශයක් සිදුකළ අතර, පහත පළවන්නේ එම අදහස් දැක්වීමයි.**

අද, පාස්කු ප්‍රහාරය සිදුවී වසර 5ක් සම්පූර්ණ වන දිනයයි. අප මෙහි රැස්ව සිටින්නේ එදා ඒ කුරිරු ත්‍රස්ත ප්‍රහාරය නිසා ජීවිත අහිමි වූ සහ බරපතළ ලෙස තුවාල වූ අප සොයුරු සොයුරියන් සිහිකරන්නටත්, ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරන්නටත්, ඔවුන්ට පින් අනුමෝදන් කරන්නටත්ය. මේ අවාසනාවන්ත සිදුවීම තුළින් කොච්චිකඩේ ශාන්ත අන්තෝනි සිද්ධස්ථානයේත්, කටුවපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේත්, මඩකළපුව සියෝන් දේවස්ථානයේත් සහ ෂැංග්‍රිලා, කිංග්ස්බරි, සිනමන්ඩ්ග්‍රෑන්ඩ් යන සංචාරක හෝටල්වලද පිපිරූ බෝම්බ නිසා අහිංසක ජීවිත 273ක් අහිමි වූ බවත්, ඒ අතර කුඩා ළමුන් අසූ දෙදෙනෙක්ද, රටවල් 14කට අයත් විදේශිකයන් 47 දෙනෙක්ද සිටි බවත් අපි දනිමු. මේ සමගම 500කට අධික පිරිසකට සුළු හෝ බරපතළ තුවාල සිදුවූ බවත්, ඉන් 30කට වැඩි පිරිසක් අද වනතුරුත් ආබාධිත තත්ත්වයේ පසුවන බවත් කිව යුතුය. මේ මහා ව්‍යසනය නිසා ශ්‍රී ලංකාවේ නූතන දේශපාලන ගමන් මගට නව අභියෝග රැසක් එකතු කර, රටේ ආර්ථික ප්‍රගතියට සුවිශාල වෙනසක් ඇතිකරන්නටද හේතු වූ බව කිව යුතු වේ.

එදා ඒ ප්‍රහාරවලින් ආරම්භ වී ඇදවැටුණු අපේ රටේ ආර්ථිකය අද වනතුරුත් ගොඩනගා ගැනීමට නොහැකි වීම මෙම මහා ව්‍යසනයෙන් සිදුවූ විනාශයේ තරම කෙතරම්දැයි අපට පහදා දෙයි. මේ පිළිබඳ විමර්ශනය කිරීම සඳහා එදා පැවැති රජය විසින් විජිත් මලල්ගොඩ විනිසුරුතුමාගේ නායකත්වයෙන් යුතු එක් කමිටුවක්ද, පාර්ලිමේන්තු තේරීම් කාරකසභාවක්ද, ජනාධිපති කොමිෂන් සභාවක්ද පත්කරනු ලැබීය. පාර්ලිමේන්තු තේරීම් කාරකසභාවේ සහ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තා මේ වන විට හෙළිදරව් කරනු ලැබ ඇත. මේ වාර්තාවල නිර්දේශ වන කරුණු ක්‍රියාත්මක කිරීම මූලික වශයෙන් පැවරුණේ 2019 නොවැම්බර් 16 වැනි දින පවත්වන ලද ජනාධිපතිවරණයේදී ජනාධිපති ධුරයට පත්වූ ගෝඨාභය රාජපක්ෂ මහතා වෙතය. ඒ කෙසේ වෙතත් තමන් එම තනතුරට පත්කර ගත්තේ ඡන්දයට පෙර මීගමුව සහ ජාඇල යන ප්‍රදේශවල පවත්වන ලද දේශපාලන රැස්වීම් දෙකකදීද එතුමා හා ශ්‍රී ලංකා කතෝලික රදගුරු මණ්ඩලය අතර සිදුවූ හමුවකදීද පාස්කු ප්‍රහාරය පිළිබඳ විනිවිද පෙනෙන පරීක්ෂණයක් පවත්වා ඒ ගැන සාධාරණය ඉටුකරන බවට සහතික වූ ඒ මහතා, ජනාධිපති කොමිෂන් සභා වාර්තාවෙන් රටේ ජනාධිපතිතුමන් ලෙස පිළිගත් දිනට පසු දිනම දුරකතනයෙන් මා අමතමින් එසේ කිරීමට තමන්ට දුෂ්කරතා ඇති බව සඳහන් කිරීම තුළත්, එම නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට යෑම නිසා තමන්ට හිතවත් ඇතැම් සංවිධානවල නායකයන් අත්අඩංගුවට ගැනීමට සහ ඔවුන්ගේ සංවිධාන තහනම් කිරීමටත් සිදුවීම තුළ වාර්තාවේ ඉදිරිපත් කර ඇති නිර්දේශ තමන්ට ක්‍රියාත්මක කරන්නට නොහැකි බවත් සඳහන් කළ අයුරු මට මතක් වේ.

ඉන් අනතුරුව එම වාර්තාවේ පළමු වෙළුමේ පිටපත් පවා අපට ලබාදීමට ප්‍රමාද කරමින්ද, එලෙසම එම වාර්තාවේ අනෙකුත් පිටපත් ලබා නොදීම තුළින්ද ජනාධිපතිතුමන් ලෙස මේ ගැන උනන්දු නොවී එම වාර්තාවේ නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමේ වගකීම තමන්ට පැවරුණත් ඒ ගැන අධීක්ෂණය කර ඇතැම් දේ පමණක් තෝරා ක්‍රියාවට නැංවීම නිර්දේශ කිරීමට තමන්ගේ රජයේ ඇමැතිවරුන් 6 දෙනකුගෙන් යුත් කමිටුවක් පත්කිරීම තුළින්ද තමා දුන් එම පොරොන්දු ඉෂ්ට කරන්නට මැළි වීම නිසා අප ඇස් ඉදිරියේ ඡන්දයට පෙර එතුමා එදා දුන් පොරොන්දු ඉෂ්ට නොකළ කෙනකුගේ තත්ත්වයට පත්විය. එලෙසම මෙම ප්‍රහාර පිළිබඳ ඒ වන විටත් කරගෙන යනු ලැබූ විමර්ශන මෙහෙයවූ ඇතැම් නිලධාරීන් එම තනතුරුවලින් ඉවත් කොට ඔවුන්ගෙන් ප්‍රධානියකු සිරගත කිරීමට පවා කටයුතු කරමින්ද, තවත් නිලධාරීන් එම නිලතලවලින් ඉවත් කර ඈත ප්‍රදේශවලට මාරු කර යැවීමට ක්‍රියා කරමින්ද, තමන්ට හිතවත් නිලධාරීන් පමණක් ඒ සඳහා පත්කරමින්ද මෙම විමර්ශන කඩාකප්පල් කිරීමට හා එතුමාට අවශ්‍ය අයුරින් මෙහෙයවීමට එතුමා ගත් පියවර ඇත්තෙන්ම කනගාටුදායකය. මේ පසුබිම තුළ මෙවැනි මහා ව්‍යසනයක් සම්බන්ධයෙන් එම රජය ගත් මන්දගාමී හා කඩාකප්පල්කාරී ක්‍රියා පිළිවෙත අප ඉදිරියේද ප්‍රහේළිකාවක් ලෙස දිස්විය.

ඒ අතරම, මේ පිළිබඳ නිදහස් හා ස්වාධීන විමර්ශනයක් ඉල්ලා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමන් වෙත යොමුකරන ලද රදගුරුතුමන්, පියතුමන් හා ගිහි සැදැහැවතුන් 34 දෙනකුගේ අස්සනින් යුත් 2021 ජුනි 12 වැනි දින දරන ලිපියට කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණු බවද, අඩු තරමින් ඒ ලිපිය තමන්ට ලැබුණු බවටවත් පිළිතුරු ලිපියක් අප වෙත නොලැබුණු බවද සඳහන් කළාය. එලෙසම 2023 ඔක්තෝබර් මස 23 වැනිදා වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාටද, රදගුරුතුමන් හා පියතුමන්ද ගිහි පැවිදි සාමාජිකයන්ද ඇතුළත් පිරිසක් විසින් යවන ලද දෙවැනි ලිපියටද අඩු තරමින් එය ලැබුණු බවටවත් පිළිතුරක් නොලැබීම තුළද පාස්කු ප්‍රහාරය පිළිබඳ අප ලද බොහෝ නවක තොරතුරු පිළිබඳ විමර්ශන අවශ්‍ය බව අප පුන පුනා කියා සිටියත් ඔවුන් විසින් අපගේ ඉල්ලීම් තුට්ටුවකටවත් ගණන් නොගන්නා තත්ත්වයක් ඇතිවීම තුළද මේ රජයද ප්‍රහාරය පිළිබඳ සාධාරණ විසඳුමක් ලබාදීමට මැළි වන බව අපට පැහැදිලි විය. මේ සියලු ආකල්ප අප තේරුම්ගත යුත්තේ කෙසේදැයි අපටම නොවැටහේ. මෙවැනි ක්‍රියාදාමයක් තුළින් එක දෙයක් පිළිබඳ බලවත් සැකයක් අපට ඇතිවේ. එනම් මෙහි සත්‍යය යටපත් කිරීමට පැවැති රජය හා වත්මන් රජයද දිගින් දිගටම ක්‍රියාත්මක වෙමින් මීට සම්බන්ධ ඇතැම් පුද්ගලයන් හා ඇතැම් ආයතන ආරක්ෂා කිරීමට කරන බවයි. මේ හැර වෙන නිගමනයකට අපට යා නොහැක. ඔවුන් මෙයට සම්බන්ධ නැත්නම් ප්‍රහාරය පිළිබඳ සත්‍ය තොරතුරු හෙළිවීම ඔවුන්ට ප්‍රශ්නයක් නොවනු ඇත.

මෙම ප්‍රහාරය පිටුපස අන්තවාදී මුස්ලිම් ත්‍රස්තවාදීන් පිරිසක් ක්‍රියා කළ බව ඇත්ත වුවත්, ඔවුන් පිටුපස තවත් බලවේග සිටි බවට සාක්ෂි මතුවී තිබියදී ඒ පිළිබඳ හරියාකාර විමර්ශනයක් සිදු නොවීම තුළ සහ සාක්ෂි යටපත් කිරීමට ඕනෑකමින් කටයුතු කිරීම තුළ වත්මන් රජයටද මෙම ප්‍රහාරය පිළිබඳ සත්‍යය සඟවා තැබීමට වුවමනාවක් ඇති බව හැර අපට වෙන නිගමනයකට එළඹිය නොහැක.

මේ සිද්ධීන් පිළිබඳ මේ වන විට හෙළිදරව් වී ඇති නවක තොරතුරු ගැන කිසිදු ප්‍රතිචාරයක් නොදක්වමින් ප්‍රහාරයට

PAGE - 10

# මහා ප්‍රහාරයට වසර 5යි



# සහරාන් හිටපු ෂැංග්‍රිලා හෝටලයේ කාමර අංක 616 ගැන

# ඇඟ හිරිවැටෙන හෙළිදරව්වක්

**පාස්කු ප්‍රහාරයට පස් වසරක් පිරුණු පසුගිය අප්‍රේල් 21 වැනිදා සමගි ජන බලවේගයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමාන් මහතා මාධ්‍ය හමුවක් කැඳවමින් එම ප්‍රහාරය පිළිබඳ ආන්දෝලනාත්මක හෙළිදරව්වක් සිදුකළේය. එහිදී ඔහු කියා සිටියේ ත්‍රස්ත ප්‍රහාරය එල්ල වීමට සති 2කට පෙර සිට අදාළ හෝටලයේ සියලු කාමරවල රැඳීසිටි පිරිස්වල නම් ලැයිස්තුවක් හෝටලය මගින් අධිකරණය වෙත ඉදිරිපත් කර තිබුණද, සහරාන් හෂීම් රැඳී සිටි කාමරයේ සිටි පිරිස් සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් ලබාදී නොමැති බවයි. එමෙන්ම හෝටලයේ 623 අංකය දරන කාමරයේ සිටි පිරිස් සම්බන්ධයෙන්ද කිසිදු තොරතුරක් වාර්තා කර නැති බවද ඒ මහතා අනාවරණ කළේය. මුජිබර් රහුමාන් මහතා සිදුකළ එම සම්පූර්ණ හෙළිදරව්ව පහත පළවේ.**

අපි දන්නවා පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් මහාධිකරණයේ නඩුවක් විභාග වෙනවා. මේ නඩුව විභාග වෙන අතරතුරදී වැදගත් කරුණු 2ක් අනාවරණ වෙලා තිබෙනවා. සහරාන් බෝම්බය පුපුරුවා ගත්තේ ෂැංග්‍රිලා හෝටලයේ කියන එක අපි සියලු දෙනාම දන්නවා. එයා ෂැංග්‍රිලා හෝටලයට නවාතැන් ගන්න අමුත්තෙක් විදියට එන්නේ 2019 අප්‍රේල් මාසේ 20 වැනිදා රාත්‍රියේ. ඔහු ඇවිල්ලා එහි නවතින්නේ 6 වැනි තට්ටුවේ 616 වැනි කාමරයේ. මේ බෝම්බය පිපිරුණාට පස්සේ ෂැංග්‍රිලා හෝටලයේ තියෙන සියලු කාමරවල ලැගුම් ගෙන හිටපු අමුත්තන් පිළිබඳ විශාල විස්තරයක් උසාවියට වාර්තා කරලා තිබෙනවා. එක කාමරයක් හැරෙන්න. ඒ කියන්නේ බෝම්බය පිපිරෙන්න සති දෙකකට කලින් ඉඳන්ම ඒ කාමරවල හිටපු අය කවුද කියන එක සම්බන්ධයෙන් ඒ සියලු වාර්තා උසාවියට මේ වෙද්දී වාර්තා කරලා තියෙනවා. නමුත් සහරාන් 2019 අප්‍රේල් මාසේ 20 වැනිදා රාත්‍රියේ එතැනට නවාතැන් ගන්න එන්න කලින් 616 කාමරයේ කවුද හිටියේ කියලා වාර්තා වෙලා නෑ.

සහරාන් හිටපු කාමරේ සහරාන් එන්න කලින් කවුද හිටියේ? ඒකෙ ලැගුම් අරගෙන හිටියේ කවුද? ඒක වාර්තා වෙලා නෑ. ඒක උසාවියට වාර්තා කරන්නේ නෑ. නමුත් හෝටලය පිළිගන්නවා ඒ කාමරයේ අමුත්තෝ හිටියා කියලා. ෂැංග්‍රිලා හෝටලය පිළිඅරගෙන තිබෙනවා සහරාන් ලැගුම් ගත් කාමරයේ අමුත්තන් හිටියා කියලා. කවුද ඒ අමුත්තෝ? ඒ පිළිබඳ තොරතුරු නෑ. ඒක තවත් අබිරහසක්. ඒක කොහොමද වෙන්නේ? 616 කාමරය සහරාන්ට කලින් කවුද හිටියේ කියන එක වාර්තා නොවෙන්නේ ඇයි? අනෙක් හැම කාමරයකම මාසයක කාලයක් කවුද හිටියේ කියලා වාර්තාවක් ලබාදීලා තියෙනවා. 616 කාමරයේ කවුද හිටියේ කියලා වාර්තාවක් ලබාදීලා නෑ. එහෙම කාටද ඉන්න පුළුවන්? හෝටලයක තමන්ගේ නම ලියාපදිංචි නොකර තමන්ගේ නම එතැන ඇතුළත් කරන්නේ නැතුව ඉන්න පුළුවන් කණ්ඩායමක් ඉන්නවද? මම ඒ ගැන හොයාබැලුවා. හොයා බැලුවම අපිට වාර්තා වෙනවා එහෙම හෝලයක තමන්ගේ වාර්තාවන් නොදී ඉන්න පුළුවන් කීප දෙනෙක් ඉන්න බව. රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන්, රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන්ගේ ආරක්ෂක අංශයේ අය, ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන්, බුද්ධි අංශවල ඉහළ නිලධාරීන් වගේ අය කාමරවල ඉන්නවා නම් ඒවා වාර්තා වෙන්නේ නෑ කියන එක තමයි අපිට දැනගන්න ලැබුණේ. ඒ හින්දා සහරාන්ගේ කාමරයේ සහරාන් එන්න කලින් කවුද පාවිච්චි කළේ? මේක අබිරහසක් හැටියට මේ නඩු විභාගයේදී අපිට වාර්තා වෙනවා.

ඒ වගේම තමයි සහරාන්ගේ කාමරයට ළඟින් තිබුණු අංක 623 දරන කාමරය. හෝටලයේ මේ බෝම්බය පිපිරුණාට පස්සේ හෝටලය විසින් වාර්තාවක් හදලා තියෙනවා. ඒ කියන්නේ හෝටලයේ ඉන්න අමුත්තෝ කීදෙනෙක් ඝාතනය වුණාද, කීදෙනෙක් තුවාල වුණාද, කීදෙනෙක් රෝහල්ගත වුණාද, කීදෙනෙක් නීත්‍යනුකූලව හෝලයෙන් පිටමං වුණාද කියලා ඒගොල්ලෝ වාර්තාවක් හදලා තිබෙනවා. ඒ වාර්තාවේ කීප දෙනෙක් ගැන සඳහන් වෙන්නේ නෑ. ඒ සඳහන් වෙන්නේ නැති පුද්ගලයෝ හිටපු කාමරයක් තියෙනවා. සහරාන් කාමරයට ළඟින් තිබුණු කාමරයක්. කාමර අංක 623. ඒ කාමරයේ හිටපු කට්ටිය කවුද කියලා වාර්තා වෙන්නේ නෑ. ඒගොල්ලෝ ඝාතනය වෙලත් නෑ, ඒගොල්ලෝ තුවාල ලබලා රෝහල්ගත වෙලත් නෑ, ඒගොල්ලෝ නීත්‍යනුකූල විදියට හෝටලයෙන් චෙක්-අවුට් වෙලත් නෑ. එහෙම නම් ඒ කණ්ඩායම ගැන ඇයි පරීක්ෂණ කරන්නේ නැත්තේ? ඒ කණ්ඩායම කොහෙද ඉන්නේ? ඒගොල්ලේ රටින් පිටමං වුණාද? එහෙම නැත්නම් අපේ රටේ තවම ඉන්නවද? ඒගොල්ලෝ ගැන ඇයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණ කරන්නේ නැත්තේ? මේ නඩුවට ඔවුන්ව ඇයි ඉදිරිපත් කරන්නේ නැත්තේ?

ඒක බරපතළ කාරණාවක්. සහරාන්ගේ කාමරයට ළඟින් තිබුණු කාමරයක්. කාමර අංක 623. ඒකේ හිටපු පුද්ගලයෝ ගැන කිසිදු ආකාරයේ සඳහනක් වෙන්නේ නෑ. ඔවුන් තුවාල ලබලත් නෑ, ඔවුන් රෝහල්ගත වෙලත් නෑ, නීත්‍යනුකූල විදියට ඔවුන් චෙක්-අවුට් වෙලත් නෑ. එහෙම නම් මෙන්න මේ කරුණු හින්දා තමයි අපි කියන්නේ මේක යම් කණ්ඩායමක් මෙහෙයවපු ප්‍රහාරයක් කියලා. ඒ කණ්ඩායම කවුද කියලා හොයාගන්න එක තමයි මේ රටට, ජාතික ආරක්ෂාවට අත්‍යාවශ්‍යම දේ. මොකද ඒ කණ්ඩායම නිදහසේ ඉන්නතුරු අපේ රටේ ජාතික ආරක්ෂාව තවම තියෙන්නේ අනතුරේ. මොකද සහරාන් මෙහෙයවපු කණ්ඩායම නිදහසේ ඉන්නවා කියලා කියන්නේ තවමත් අපේ රටේ ජාතික ආරක්ෂාව අනතුරේ. ඒ හින්දා ඒක හොයාගැනීම තමයි අපේ රටේ පුරවැසියන් හැටියට සියලු දෙනාගෙම වගකීම. මම හිතන්නේ කාදිනල් උන්නාන්සෙත් දිගින් දිගටම සටන් කරන්නේ ඔවුන්ව හොයාගන්න ඕනේ කියලා. ඒක තමයි අපිත් මේ කැගහන්නේ. අපිත් මේ කියන්නේ. මොකද මේ කරුණු දිහා බැලුවම අපිට පේනවා සහරාන්ව මෙහෙයවපු කණ්ඩායමක් ඉන්න බව.

මේ සම්බන්ධයෙන් නඩු විභාගයක් යනවා. චූදිතයෝ කියලා විසිගානක් නම්කරලා තියෙනවා. නීතිපති දෙපාර්තමේන්තුව ඔවුන්ට චෝදනා එල්ල කරලා, නඩු විභාගයක් යනවා. ඒ නඩු විභාගයක් යන අතරේ අපිට තිබෙනවා ප්‍රශ්නයක් කවුද මේ සාක්ෂිකාරයෝ කියලා. රජයේ සාක්ෂිකාරයෝ හැටියට නම්කරලා තියෙන්නේ කවුද? අපි දන්න විදියට නම් මේ පරීක්ෂණය කරපු කවුරුවත් නෑ සාක්ෂිකාරයෝ හැටියට. පළමු දේ තමයි මේ බෝම්බය පිපිරුණාට පස්සේ මේ පරීක්ෂණයේ ප්‍රධානියා තමයි හිටපු නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න. ඊළඟට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර. ශානි අබේසේකර තමයි ඒ බෝම්බ අටම පිපිරෙව්ව ස්ථාන අට ගැනම පරීක්ෂණ පවත්වපු ප්‍රධාන නිලධාරියා. එයාගේ බාරයේ තමයි මේ පරීක්ෂණ ඔක්කොම සිද්ධ වුණේ. ඊළඟට සහරාන්ව හොයාගෙන ගිය නාලක සිල්වා.

අඩුම ගානේ පහුගිය කාලේ පුරාම අලුත් කරුණු රාශියක් මේ සමාජයට එළියට දැම්ම කාදිනල් හිමියන්. මේ කවුරුවත් සාක්ෂිකාරයෝ හැටියා නම්කරලා නෑ. මේගොල්ලන්ව නම්කරන්නේ නැතුව ප්‍රහාරයට කිසිම සම්බන්ධයක් නැති ප්‍රහාරයේ අගක් මුලක් දන්නේ නැති අයව සාක්ෂිකාරයෝ ලෙස නම්කරලා තියෙනවා. ඉතින් කොහොමද අලුත් කරුණු ඉදිරියට එන්නේ? ඒ හින්දා තමයි අපි කියන්නේ කවුරු හරි මේක පිටිපස්සේ ඉඳගෙන මෙහෙයවනවා කියලා. ඇයි නාලක සිල්වාව මේකේ සාක්ෂිකාරයෙක් කරන්නේ නැත්තේ? ඇයි රවී සෙනෙවිරත්නව මේකේ සාක්ෂිකාරයෙක් කරන්නේ නැත්තේ? මේ බෝම්බකරුවන් අටදෙනා පිළිබඳ පරීක්ෂණ කරපු ප්‍රධාන නිලධාරියා වුණු ශානි අබේසේකරව ඇයි සාක්ෂිකාරයෙක් කරන්නේ නැත්තේ?

කාදිනල් හිමියන් මේකේ කරුණු හුගක් හෙළිදරව් කළා පහුගිය කාලේ. ඇයි උන්වහන්සේව සාක්ෂිකාරයෙක් කරන්නේ නැත්තේ? ඒ හින්දා අපිට සැකය තව තව තහවුරු වෙනවා. ආණ්ඩුව මේක යටපත් කරන්න, මේක වෙනත් දිශාවකට ගෙනියන්න උත්සාහ කරනවා.

අවසාන වශයෙන් කියන්න ඕනේ අපි සමගි ජන බලවේගය හැටියට මේ ආණ්ඩුව මේක කරන්නේ නැත්නම් අපේ රජයක් යටතේ අපි පූර්ණ අධිකරණ බලතල තිබෙන කොමිෂන් සභාවක් පත්කරලා මේ පරීක්ෂණ නැවතිච්ච තැනින් ඉදිරියට ගෙනයනවා කියන පණිවුඩය. ඒ සහතිකය අපි රටට ලබාදීලා තිබෙනවා. ඒ නිසා අද වික්‍රමසිංහ - රාජපක්ෂ පාලනය පාස්කු බෝම්බ ප්‍රහාරයේ කොතරම් සත්‍ය කරුණු සඟවන්න උත්සාහ කළත්, කොතරම් සත්‍ය කරුණු ඔවුන් හෙළිදරව් නොකරන්න උත්සාහ කළත්, සමගි ජන බලවේගයේ රජයක් යටතේ මේකේ සත්‍ය කරුණු ටික හෙළිදරව් කරලා මේ අපරාධයට මුල්වෙච්ච සියලු දෙනාම නීතිය ඉදිරියට ගේනවා කියන පණිවුඩය පාස්කු බෝම්බ ප්‍රහාරය සිදුවෙලා අවුරුදු පහක් ගතවෙන මේ අවස්ථාවේදී අපි නැවත වතාවක් මතක් කරන්න කැමැතියි.

News Center යූටියුබ් නාලිකාවෙනි



# චීනය සජිත්ව පුදුම කරවයි

කපිල පුංචිමාන්නගේ

## රාජ්‍ය රහස්

## චීනය බියගමට...

පසුගිය සතියේ රාජ්‍ය රහස් තීරය ඔස්සේ විශේෂ තොරතුරක් හෙළිදරව් කරමින් අප කියා සිටියේ චීන රජයේ ඉහළ නිලයක් දරන සුන් හයියැන් මහත්මිය විශේෂ සංචාරයක් සඳහා 21 වැනි දින ලංකාවට පැමිණීමට නියමිතව ඇතැයි යැයි කියාය. අප අනාවරණ කළ පරිදිම ලංකාවට පැමිණි චීන අමාත්‍යවරිය ආණ්ඩුවේ මෙන්ම විපක්ෂයේ ප්‍රධාන පක්ෂ හමුවී සාකච්ඡා කිරීමට පියවර ගත්තාය. කෙසේවෙතත් චීන අමාත්‍යවරියගේ මෙම ගමන පසුපස විශේෂ කරුණු කිහිපයක්ම තිබේ. හයියැන් මහත්මිය ලංකාවට පැමිණියේ නිකන්ම ආවාට ගියාට නොව, ලංකාවේ දේශපාලනය සම්බන්ධයෙන් කොළඹින් බීජිං නුවරට යැවුණු වාර්තා රැසක් පරිශීලනය කිරීමෙන් අනතුරුවය. මෙම වාර්තාවලින් බීජිං නුවරට දැනුම්දී තිබුණේ ඉදිරි ජනාධිපතිවරණයේ ප්‍රතිඵලය කුමක් විය හැකිද යන්න සම්බන්ධයෙන්ය. දැනට පවතින තත්ත්වය යටතේ ජනාධිපතිවරණයේ ඉදිරියෙන් සිටින්නේ කවුද, එහි අපේක්ෂකයන් ගනු ඇතැයි උපකල්පය කළ හැකි ප්‍රතිශතයන් මොනවාද, ආණ්ඩුවේ ජනප්‍රියත්වය පවතින්නේ කුමන තැනකද ආදී වශයෙන් වාර්තා රැසක් මෙහිදී හයියැන් මහත්මිය ලංකාවට පැමිණීමට පෙරම ඇගේ අතට පත්ව තිබිණි. එම වාර්තාවල දැක්වුණේ සජබයට සියයට 39කුත්, ජවිපෙට සියයට 20කුත්, පොහොට්ටුවට සියයට 9කුත්, එජාපයට සියයට 5කුත් වශයෙන් ඡන්ද ලැබීමේ ප්‍රවණතාවයක් රට ඇතුළේ ඇතැයි කියාය.

කෙසේ වෙතත් හයියැන්ගේ ලංකා ගමනේදී කිසිවකුත් නොදන්නා අතිශය රහසිගත සිදුවීමක්ද විය. එය සාමාන්‍යයෙන් රාජ්‍යතාන්ත්‍රික කණ්ඩායමක් වෙනත් රටකට ගිය විට සිදු නොකරන්නකි. මෙහිදී හයියැන් මෙරට චීන තානාපතිවරයාට දැනුම්දී තිබුණේ තමන් ලංකාවට පැමිණි පසු ඉදිරි ජනාධිපතිවරණයේ ප්‍රතිඵල සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා තමන්ටම ලංකාවේ ඡන්දදායකයන් හමුවිය යුතු බවත්, ඒ සඳහා සුදුසු ඡන්ද කොට්ඨාසයක් තෝරාගෙන රහසිගතව තබාගන්නා ලෙසටත්ය. ඒ අනුව මෙරට චීන තානාපතිවරයා හයියැන් මහත්මියට යෑම සඳහා තෝරාගෙන තිබුණේ ගම්පහ බියගම ආසනයය. එමෙන්ම හයියැන් මහත්මිය ලංකාවට පැමිණි වහා ඇගේ ගමනේ පළමු සංචාරය ලෙස ඉතා රහසිගතව සිදුකෙරුණේද මෙම බියගම සංචාරයය. සැලසුම් කළ ආකාරයටම ඇය ජනතාව සමග කතාබස් කරමින් කලින් සකස් කරගත් ප්‍රශ්නාවලියකට පිළිතුරු ලබාගනිමින් කොළඹින් බීජිං නුවරට ලැබී තිබූ දේශපාලන වාර්තා සත්‍යද යන්න තහවුරු කරගැනීමට කටයුතු කොට තිබිණි. එහිදී අදාළ වාර්තා 100%ක්ම නිවැරැදි බව තහවුරු කරගත් හයියැන් මහත්මිය තම සංචාරයේ ඉදිරි හමුවීම් පිළිබඳ යම් යම් වෙනස්කම් කිහිපයක්ද ඉන් පසුව සිදුකිරීමට පියවර ගත්තාය.

## අනුර හොරෙන්ම චීනයේ...



එම ප්‍රතිඵලවලට අනුව විපක්ෂයේ ප්‍රධාන පක්ෂය වන සමගි ජන බලවේගය සමග පවත්වන සාකච්ඡාවේ යම් වෙනසක් කිරීමට ඇය කටයුතු කළාය.

සාමාන්‍යයෙන් විපක්ෂයේ දේශපාලන පක්ෂ හමුවද්දී දෙපාර්ශ්වයේ නියෝජිතයන් පමණක් හමුවී සාකච්ඡා කිරීම සාමාන්‍ය සම්ප්‍රදාය වුවද, සජබය සමග සාකච්ඡාවේදී එය වෙනස් කරමින් විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා සමග මුහුණට මුහුණ සාකච්ඡාවක් පැවැත්විය යුතු බවට හයියැන් මහත්මිය තීරණය කළාය.

ඒ අනුව චීන තානාපතිවරයාට ඒ බව දැනුම් දීමෙන් අනතුරුව ඔහු විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා සමග සාකච්ඡා කොට එම අවස්ථාව සූදානම් කිරීමට පියවර ගෙන තිබිණි.

කාලසටහනට අනුව හයියැන් මහත්මිය පළමුව මුණගැසුණේ ජවිපෙ නියෝජිත පිරිසය. මෙහිදී කිසිවකුත් නොදත් තවත් තොරතුරක්ද මෙවර 'රාජ්‍ය රහස්" තීරය ඔස්සේ හෙළිදරව් කිරීමට අප සූදානම්ය. ඒ, ජවිපෙ නායක අනුර කුමාර දිසානායක මහතා ඉතා රහසිගතව සිදුකළ චීන සංචාරයක් පිළිබඳවය. පසුගිය දෙසැම්බරයේ සිදුකළ මෙම චීන සංචාරය කෙතරම් රහසිගත ආකාරයට අනුරත්, චීනයත් තබාගත්තාද කියනවා නම් ඒ පිළිබඳ කිසිදු වචනයක් කිසිදු අවස්ථාවක දෙපාර්ශ්වයෙන් එළියට ආවේ නැත.

අඩුම තරමින් ඒ සම්බන්ධ ඡායාරූපයක් හෝ කිසිදු මාධ්‍යවල පළවූයේ නැත.

මෙම අතිශය රහසිගත චීන සංචාරයේදී අනුර මුණගැසුණේ මේ කියන චීන උප අමාත්‍යවරිය වන සුන් හයියැන් මහත්මියය.

එම නිසා අනුර සහ හයියැන් අතර කිසියම් දැනහැඳුණුම්කමක්ද තිබිණි. ඒ අනුව පැලවත්ත පක්ෂ මූලස්ථානයේ පැවැති මෙම හමුවට දෙපාර්ශ්වයේ ඉහළ නියෝජිතයන්ද එක්ව සිටි ආකාරයක් දැකගත හැකි විය.

## පොහොට්ටුව පිපිලා...

ඉන් අනතුරුව හයියැන් මහත්මිය ඇතුළු කණ්ඩායම මුණගැසුණේ පොහොට්ටුවේ නියෝජිතයන්ය. එම පිරිසට බැසිල් රාජපක්ෂ, නාමල් රාජපක්ෂ ඇතුළු කණ්ඩායමක් එක්ව සිටියහ. හමුව ආරම්භයේදීම සුන් හයියැන් මහත්මිය පොහොට්ටුවේ යළි පිබිදීම පිළිබඳව තරමක් විමතියෙන් අදහස් දැක්වීම විශේෂ සිදුවීමක් විය. ඇය එහිදී කියා සිටියේ අරගලයෙන් අනතුරුව බින්දුවටම වැටුණු පොහොට්ටුව ඉතා කෙටි කාලයක් ඇතුළත නැවත ජනතාව අතරට පැමිණ ඇතැයි කියාය. ඊට පිළිතුරු දුන් බැසිල් කියා සිටියේ පක්ෂය සතුව ඇති බිම් මට්ටමේ ජාලය ඒ සඳහා විශාල දායකත්වයක් සැපයූවා යැයි කියාය.

## සජිත්ව පුදුම කරයි...

කෙසේ වෙතත් තීරණාත්මක සාකච්ඡාව පැවැත්වුණේ හයියැන් මහත්මිය සහ සජබ නියෝජිතයන් අතරය. විපක්ෂ නායක කාර්යාලයේ පැවැති මෙම හමුවේදී දෙපාර්ශ්වයේ නියෝජිතයන් අතර පැයක පමණ කාලයක් අදහස් හුවමාරු විය. එම සාකච්ඡාවෙන් පසුව කලින් සැලසුම් කළ පරිදිම වෙනත් කිසිදු සාමාජිකයකු නොමැතිව සජිත් සහ හයියැන් මහත්මිය අතර පමණක් වූ මුහුණට මුහුණ සාකච්ඡාව ආරම්භ විය. මෙහිදී සාකච්ඡාව ආරම්භයේදීම හයියැන් මහත්මිය සජිත්ට කියා සිටියේ, 'ඔබ පුදුම කරවන විශේෂ යමක් මගේ ළඟ තියෙනවා' යැයි කියාය. සජිත්ද පුදුමයට පත්ව ඒ කුමක්ද කියා විමසද්දී හයියැන් මහත්මිය තමන් පෞද්ගලිකවම ගොස් බියගම ප්‍රදේශයේ සිදුකළ මත විමසුම පිළිබඳ තොරතුරු සජිත්ට දැනුම් දී සිටියාය. ඉන් අනතුරුව දෙදෙනා අතර ඉදිරි රජයක් යටතේ දෙරටේ මිත්‍රත්වය ශක්තිමත් කරගන්නා ආකාරය පිළිබඳවද, චීනය ලංකාවට ආධාර කරන ආකාරය පිළිබඳවද, ලංකාවේ චීන විදෙස් ප්‍රතිපත්තිය පිළිබඳවද, දකුණු ආසියානු කලාපයේ ආරක්ෂක ගැටලුව වැනි ඉතා සංවේදී කරුණු රැසක් පිළිබඳවද අදහස් හුවමාරු විය. මෙම සාකච්ඡාවේදී දෙදෙනා අතර මුහුණට මුහුණ හමුවට පැය භාගයක් පමණක් වෙන්කොට තිබුණත් සාකච්ඡාව ඉතා තීරණාත්මක එකක් වූ නිසා විනාඩි 45ක් දක්වා එම සාකච්ඡාව ඇදී ගිය ආකාරයක් දැකගත හැකි විය.

## රයිසිගේ ලංකා ගමන...

පසුගිය සතියේ මෙරට ප්‍රධානම මාතෘකාවක් බවට පත්වූයේ ඉරාන ජනාධිපති ඊබ්‍රාහිම් රයිසි මහතා දිවයිනට පැමිණ උමාඔය ව්‍යාපෘතිය විවෘත කර ලංකාවෙන් පිටවූවාටත් වඩා, ඒ මහතාගේ කොළඹ ගමන හේතුකොට ගෙන ආරක්ෂක හේතු මත පාරවල් වැසීම නිසා දහස් ගණනක ජනතාවකට මහ පාරේ පැය ගණනක් සිරවී සිටින්නට සිදුවීමය. මේ කරුණු මාධ්‍යවලින් දැකගන්නට ලැබුණත් මාධ්‍ය නොදන්නා තවත් විශාල කතාවක්ද ඉරාන ජනාධිපතිවරයාගේ ලංකා සංචාරය පසුපස තිබිණි. ඇත්තම කියනවා නම් ඉරාන ජනාධිපතිවරයාගේ මේ ලංකා සංචාරයට ආණ්ඩුව මුහුණ දුන්නේ යුද්ධයක් කරනවා හා සමාන පසුබිමක සිටය.

ඉරාන ජනාධිපතිවරයාගේ ලංකා සංචාරය සඳහා මූලික පදනම වැටුණේ ඉකුත් වසරේ ජනාධිපතිවරයා ගිය ඇමෙරිකානු සංචාරය අතරතුරදීය. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයට සහභාගි වීම සඳහා ගිය ගමනේදී ලංකාවේ සංචාරයකට පැමිණෙන ලෙස ජනාධිපතිවරයා ඉරාන ජනාධිපතිවරයාට ආරාධනා කර තිබිණි. පසුව ඉරානය කළ දැනුම්දීමකින් කියැවුණේ උමාඔය විවෘත කිරීමේ අවස්ථාවට ඉරාන ජනාධිපතිවරයා සහභාගි වීමට සූදානමින් පසුවනවා යැයි කියාය. ඒ වන විට ලෝක දේශපාලන තුළ ඉරානය සම්බන්ධයෙන් වැඩි අවධානයක් නොතිබුණු නිසා කිසිදු ගැටලුවක් මතුව තිබුණේ නැත. නමුත් පසුගිය මාසය වන විට ඊශ්‍රායල් පලස්තීන යුද්ධයට ඉරානයද පැටලී ඇමෙරිකාවද ඊට අත දැමීම නිසා ඉරාන ජනාධිපතිවරයා ලෝකයේම මාතෘකාවක් බවට පත්ව තිබිණි. එවැනි වටපිටාවකදී ඉරාන ජනාධිපතිවරයාගේ ලංකා ගමන අතරතුර ඔහුගේ ආරක්ෂාව තහවුරු කිරීම බරපතළ ගැටලුවක් බව අලුතෙන් කිවයුතු නැත. ඒ අනුව, වඩාත්ම බරපතළ ගැටලුවකට මුහුණ දුන්නේ මෙරට විදේශ කටයුතු අමාත්‍යාංශයය. මේ අවස්ථාවේදී ඉරාන ජනාධිපතිවරයාට ලංකාවේ සංචාරය නොකරන ලෙස කිව නොහැකි නිසා ඉරානය පැත්තෙන්ම සංචාරය අත්හිටුවනු ඇති බවක් ඔවුන් මුලින් සිතා සිටියේය. නමුත් ඉරානය පැත්තෙන් සංචාරය තහවුරු කිරීමත් සමග ඊළඟ ගැටලුව වූයේ ඉරාන ජනාධිපතිවරයාට ආරක්ෂාව සපයන ආකාරය පිළිබඳවය. විශේෂයෙන්ම ඉරාන ජනාධිපතිවරයා කිසිදු අවස්ථාවකදී ලංකාව ඇතුළත ගුවන් ගමන් සිදු නොකරනු ඇති බවට ඉරානය පැත්තෙන් දැනුම් දීමක් කොට තිබූ නිසා ගොඩබිම් මාර්ගයෙන් ඉරාන ජනාධිපතිවරයාට ආරක්ෂාව සපයමින් රැගෙන යෑම ඉතා භාරදූර කර්තව්‍යයක් වී තිබිණි. ලොකුම ගැටලුව වූයේ කටුනායකින් ඉරාන ජනාධිපතිවරයා පිළිගෙන උමාඔය දක්වා රැගෙන යෑමය. එවිට ගොඩබිම් මාර්ගයෙන් දීර්ඝ ගමනක් යෑමට සිදුවන නිසා ඉරාන ආරක්ෂක බලධාරීන් විමසා සිටියේ උමාඔයට ආසන්නම ගුවන් තොටුපළ කුමක්දැයි කියාය. මත්තල ගුවන් තොටුපළ කරළියට පැමිණියේ ඉන් අනතුරුවය. ඒ අනුව ඉරාන ආරක්ෂක බලධාරීන් දැනුම් දුන්නේ ඉරාන ජනාධිපතිවරයා මත්තලින් ලංකාවට පැමිණ එතැන් සිට ගොඩබිම් මාර්ගයෙන් උමාඔය විවෘත කිරීමේ අවස්ථාවට එකතු වනු ඇති බවකි.

කෙසේ වෙතත් ආණ්ඩුවට කෙසේ හෝ ඉරාන ජනාධිපතිවරයා කොළඹට ගෙන්වා ගෙන ඔහුත් සමග සාකච්ඡා කොට ලොකු ෂෝ එකක් පෙන්වීමට අවශ්‍යව තිබිණ. ඉරාන ජනාධිපතිවරයා ඊශ්‍රායල් පලස්තීන ප්‍රශ්නය මුල්කරගෙන පලස්තීනයට සහාය දැක්වීම හේතුවෙන් මෙරට මුස්ලිම් ජනතාවගෙද විශාල ප්‍රසාදයකට ලක්ව සිටීම ඊට හේතුවය. ආණ්ඩුව සහ මුස්ලිම් ප්‍රජාව අතර මේ වන විට යම් යම් ගැටලු මතුව තිබීම හේතුවෙන් ඉරාන ජනාධිපතිවරයා සමග කොළඹ හමුවක් සංවිධාන කිරීම හරහා මුස්ලිම් ජනතාවගේ සහයෝගය ආණ්ඩුව වෙත ලබාගැනීමට ආණ්ඩුවේ අපේක්ෂාව විය. මේ හේතුව නිසා මත්තල සිට යළිත් ඉරාන ජනාධිපතිවරයා කොළඹට රැගෙන ඒම සඳහාත්, කොළඹදී ජනාධිපතිවරයා සමග පැවැත්වෙන හමුව අවසන් කොට කටුනායක අධිවේගී මාර්ගය ඔස්සේ ඉරාන ජනාධිපතිවරයා රැගෙන යෑම සඳහාත් ඉතා දීර්ඝ වේලාවක් අධිවේගී මාර්ගය සහ අවශේෂ මාර්ග වසාදැමීමට මෙරට බලධාරීන්ට සිදුවිය. ඒ හේතුවෙන් සතියේ දවසක් වූ පසුගිය බදාදා දින දීර්ඝ කාලයක් ප්‍රධාන මාර්ගවල එක තැන සිරවී සිටින්නට මගී ජනතාවට සිදුවිය. එමෙන්ම මත්තල තිබූ ඉරාන ජනාධිපතිවරයා පැමිණි ගුවන් යානය පසුව කටුනායකට රැගෙන ඒමටත් ඉරාන ආරක්ෂක බලධාරීන්ට සිදුවිය.

ඉරාන ජනාධිපතිවරයා ලංකාවේ සිටියදී තවත් විශේෂ සිදුවීම් කිහිපයක්ම සිදුවිය. ඉන් එකක් වූයේ ඉරානයත් සමග වෙළෙඳ ගිවිසුම්වලට අස්සන් තබන රටවලට ආර්ථික සම්බාධක පැනවීමේ අවදානමක් ඇති බවට ඇමෙරිකාව විසින් විශේෂ නිවේදනයක් නිකුත් කිරීමය. මීට අමතරව ඇමෙරිකාව ප්‍රධාන වගකීමක් දරන ආසියා පැසිෆික් කමාන්ඩ් එක හදිසි යුද අභ්‍යාසයක් ත්‍රිකුණාමලයේ සිදුකිරීමට අවශ්‍ය බව දැනුම් දී සිටියේය. ඒ අනුව ඉරාන ජනාධිපතිවරයා ලංකාවේ සිටියදීම ඇමෙරිකානු භටයන්ට ත්‍රිකුණාමලයේ යුද අභ්‍යාසයක් සිදුකිරීමට අවශ්‍ය අනුමැතිය ලබාදීමට ආණ්ඩුවට සිදුවිය.

## මහින්දගේ නම නෑ...

මෙහිදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සම්බන්ධයෙන් යමක් සඳහන් කළ යුතුව තිබේ. මෙම ඉරාන උමාඔය ව්‍යාපෘතිය සඳහා යෝජනාව ඉදිරිපත් කළේ වෙන කවුරුවත් නොව හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාය. එවක හිටපු ඉරාන ජනාධිපති අහමඩ් නෙජාඩ්ගෙන් ඒ සඳහා අවශ්‍ය මූල්‍යාධාර ලබාගැනීමට පවා මහින්ද කටයුතු කොට තිබිණි. නමුත් මෙහිදී දැකගන්නට ලැබුණු විශේෂම සිදුවීම වූයේ උමාඔය විවෘත කිරීමේ උත්සවයට සකස් කරනු ලැබ තිබූ ආරාධනා පත්‍රයේ මහින්දගේ නම හෝ ඡායාරූපය හෝ පළව නොතිබීමය. ඒ වෙනුවට එහි ඉරාන ජනාධිපති රයිසිගේත්, රනිල්ගේත්, දිනේෂ්ගේත්, පවිත්‍රාගේත්, කංචන විජේසේකරගේත්, ශෂීන්ද්‍ර රාජපක්ෂගේත් නම් සහ ඡායාරූප පමණක් ඇතුළත් කොට තිබිණි. මේ බව අප එම ආරාධනා පත්‍රය දුටු වහා අඅඅග ජ්අර්ජ්බැඅිගකන අප වෙබ් අඩවිය ඔස්සේ පළකිරීමට කටයුතු කළෙමු. ඒ සමගම එම පුවත පත්තු වී ගිය ආකාරයක් දැකගත හැකි වූ අතර, ජනාධිපතිවරයාද වහාම මහින්දට කතාකොට උමාඔය විවෘත කිරීමේ උත්සවයට පැමිණෙන ලෙසත්, අවශ්‍ය නම් තමන් ඒ සඳහා හෙලිකොප්ටර යානයක් ලබාදීමට කටයුතු කරන බවත් සඳහන් කර සිටියේය. නමුත් මහින්ද ජනාධිපතිවරයාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළා පමණක් නොව, උමාඔය විවෘත කිරීමේ උත්සවයට පවා සහභාගී නොවී සිටීම විශේෂ සිදුවීමක් විය.

කෙසේ වෙතත් මෙම සිදුවීම පසුගිය බ්‍රහස්පතින්දා දින කොළඹ පැවැති දැවැන්ත ඉන්දීය ආයෝජනයක් වූ ෂඔක ස්ඒබ්ාසච් හෝටලය විවෘත කිරීම සඳහා යම් වාසිසහගත තත්ත්වයක් ගෙන දුන් ආකාරයක් දැකගත හැකි විය. ඒ, එම උත්සවයට හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට ආරාධනා කිරීමට වගකිවයුත්තන් කටයුතු කර තිබීම හරහාය. ෂඔක ස්ඒබ්ාසච් හෝටලයේ ඉදිකිරීම් ආරම්භ කළේ ගෝඨාභයගේ පාලන සමයේදීය. ඒ සඳහා හිටපු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා විශාල වැඩකොටසක් කර තිබිණි. ඒ අනුව ගෝඨාභය මෙම උත්සවයට සහභාගි වී සිටි අතර, ජනාධිපතිවරයා සිය කතාවේදී බැසිල් රාජපක්ෂ මහතාට විශේෂ ස්තුතියක් සිදුකිරීමට කටයුතු කිරීම විශේෂ සිදුවීමක් විය.

## විපක්ෂයේ ඩීල්කාරයෝ...

මේ වනවිට ජනාධිපතිවරණ උණුසුම කෙමෙන් කෙමෙන් රට ඇතුළේ ඉහළ නගිමින් පවතින ආකාරයක් දැකගන්නට පුළුවන. එසේ රට ඇතුළේ දේශපාලනය උණුසුම් වෙද්දී නැවත වතාවක් ඩීල් දේශපාලනයද ඊට සමගාමීව හිස ඔසවමින් පවතින ආකාරයක් දැකගන්නට පුළුවන. විවිධ මන්ත්‍රීවරු විවිධ පක්ෂ සමග, විවිධ දේශපාලන නායකයන් සමග තිරය පිටුපස කරන සාකච්ඡා මේ දිනවල සාමාන්‍ය දෙයක් බවට පත්ව තිබේ. විපක්ෂයේ ප්‍රධාන



# මහින්දට උමා ඔයේදී කැපිල්ලක්

කපිල පුංචිමානගේ

රාජ්‍ය රහස්

පක්ෂය වූ සමගි ජන බලවේගයේද මේ ආකාරයට ඩීල් දමන මන්ත්‍රීවරුන් කිහිප දෙනකු නැත්තේ නොවේ. අපි පසුගිය කාලය පුරාම 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ සමගි ජන බලවේගය ඇතුළේ සිටින ඔස්තාර්ලා යැයි කියන පිරිස්, ජ්‍යෙෂ්ඨයන් යැයි කියන පිරිස් ආණ්ඩුව සමග දැමූ ඩීල් පිළිබඳ වාර්තා කර සිටියෙමු. විවිධ කරුණු මුල්කරගෙන මෙම විපක්ෂ මන්ත්‍රීවරුන් ආණ්ඩුව සමග ඩීල් දමන්නට පෙලඹී ඇති බවද අපි එහිදී හෙළිකර සිටියෙමු. විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් ආණ්ඩුව සමග ඩීල් දමා තිබුණේ සිය දූදරුවන් විදෙස් රටවල තානාපති කාර්යාලවලට රිංගවා ගැනීම සඳහාත්, තවත් මන්ත්‍රීවරුන් සිය හිතවත් කෝටිපති ව්‍යාපාරිකයන්ට බාර් ලයිසන් ලබාගැනීම සඳහා ආණ්ඩුව සමග ඩීල් දමා තිබුණු බවක් අප අනාවරණ කර සිටියෙමු. තවත් සමහරු කමිටුවල තාන්න මාන්න ලබාගැනීම සඳාහාත්, ආණ්ඩුවෙන් විවිධ වරප්‍රසාද ලබාගැනීම සඳහාත් ආණ්ඩුව සමග ඩීල්වල නිරත වී තිබිණි. තවත් සමහරු විපක්ෂය ඇතුළේ ගොඩනැගෙමින් පවතින දැවැන්ත සන්ධානය කඩාබිඳ දැමීම සඳහා ආණ්ඩුව සමග ඩීල් දමා තිබූ ආකාරයක්ද අපි සඳහන් කර සිටියෙමු. මේ ඩීල්කාර ඇතැම් දේශපාලනඥයන් ඡන්ද කාලවලදී කෝටි ප්‍රකෝටි ගණනින් විකිණෙන පුද්ගලයන් බවට පත්වන්නන් බවද අපි එහිදී පෙන්වා දුන්නෙමු.

අප එම හෙළිදරව්ව සිදුකළේ අපට කාගෙන්වත් කිසියම් හෝ ලාභ ප්‍රයෝජනයක් ගැනීමට හෝ පක්ෂ ඇතුළේ අභ්‍යන්තර අර්බුදයක් ඇතිකිරීමේ අරමුණෙන් හෝ වෙනත් හේතුවක් නිසා හෝ නොව මේ රටේ අහිංසක ජනතාවගේ ඡන්ද අයිතියට මේ සියලු දෙනා ගරු කළ යුතු නිසාය. ජනතාව මේ දේශපාලනඥයන්ට ඡන්දය ලබාදී විපක්ෂයේ තැබුවේ විපක්ෂයේ කාර්යභාරය ඉටුකිරීමට මිස ආණ්ඩුව සමග ඩීල් දැමීමට නොවේ. ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් පෙනී සිටීමට මිස ආණ්ඩුවේ වරප්‍රසාද ලබාගැනීමට නොවේ. ආණ්ඩුවෙන් බාර් ලයිසන් ගන්නට නොවේ.

## තරහ වුණත් කමක් නෑ...

අප වරින් වර විපක්ෂයේ මෙම ඩීල් දේශපාලනය පිළිබඳ තොරතුරු හෙළිකිරීමෙන් පසු සජබෙ ඔස්තාර් කෙනකුද, වයඹ සහ දකුණ නියෝජනය කරන දේශපාලනඥයන් කිහිප දෙනකුද අපත් සමග හිත් අමනාපයෙන් සිටින බව අපට ආරංචිය. නමුත් අපට ඊට කිරීමට කිසිවක් නැත. අප රටට කියන්නේ මේ දේශපාලනයේ තියෙන තිත්ත ඇත්තය. මීට වසර දෙකකට ඉහතදී ජනතාව ලක්ෂ ගණනක් පාරට බැස එපා කියා පන්නා දැමූයේ මේ දූෂිත ඩීල් දේශපාලනයය. ඒ අනුව අප ඉදිරි තීරණාත්මක මැතිවරණයක් ආසන්නයේදී මේ ඩීල් දේශපාලනයේ සිටින පුද්ගලයන් කිහිප දෙනා ගැන නම් ගම් සහිතව රටට හෙළිදරව් කිරීමට සූදානම්ය. පවුල්වල අයට ආණ්ඩුවේ තනතුරු ගත් දේශපාලනඥයන්ගේ නම් හෙළිකිරීමට අප සූදානම්ය. හිතවතුන්ට බාර් ලයිසන් අරන් දුන් දේශපාලනඥයන් හෙළිකිරීමට අප සූදානම්ය. ජනාධිපතිවරයාට අවශ්‍ය ආකාරයට විපක්ෂයේ සන්ධානය කැඩීම සඳහා යටිකුට්ටු වැඩ කළ දේශපාලනඥයන්ගේ නම් හෙළිකිරීමට අප සූදානම්ය.

සජබය ජී.එල්. පීරිස්, නාලක ගොඩහේවා වැනි ආණ්ඩුවත් සමග සිටි ප්‍රබලයන් විපක්ෂයට ගෙන ඔවුන් සමග සන්ධානගත වීමට සූදානම් වෙද්දී මේ කියන ඩීල්කාර කණ්ඩායම් ජී.එල්.ලාටත් ගොඩහේවාලාටත් රාජපක්ෂවරුන් සමග සිටියා යැයි කියමින් පහර ගැසූහ. ජනාධිපතිවරයා කුරුණෑගලදී ජී.එල්.ට සට්ටැඹිරාළ කියමින් පහර ගසද්දී විපක්ෂයේ මේ ඩීල් කණ්ඩායමද ජී.එල්.ට පහර ගැසීමට කටයුතු කළහ. ජී.එල්. සහ ගොඩහේවා අධෛර්යමත් වන ආකාරයේ ප්‍රකාශ නිකුත් කළහ. මේ බව අප පසුගිය කාලයේදී ඊට අදාළ සිදුවීම්ද වාර්තා කරමින් ජනතාවට කියා සිටියේ ජනතාවට වගකිව යුතු මාධ්‍යයක් වශයෙන් මේ ඩීල්කාර දේශපාලනය පිළිබඳ රටට තොරතුරු අනාවරණ කොට එම ඩීල් දේශපාලනයට අවසන් තිත තැබිය යුතු නිසාය. ඒ අනුව මෙම ඩීල් දේශපාලනඥයන්ගෙන් යම් යම් පුද්ගලයන් අද ඊයේ පමණක් නොව අතීතයේ සිටම බියර් කොම්පැනි සමග, සිගරට් කොම්පැනි සමග දැමූ ඩීල්ද මේ වන විට අප වෙත ලැබී අවසානය. ඉතා තීරණාත්මක අවස්ථාවකදී ඒ සියල්ල නම්ගම් සහිතව ජනතාව හමුවේ තැබීමට අප සූදානම්ය.

## මෙන්න අලුත්ම ඩීල් එක...

එමෙන්ම මෙවර අප 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ පසුගියදා සිදුවූ තවත් අලුත්ම ඩීල් එකක් පිළිබඳ තොරතුරු රටට හෙළිකිරීමට සූදානම්ය. ඒ සඳහා ආණ්ඩුව පැත්තෙන් මූලිකත්වය ගෙන තිබුණේ ඩීල් දේශපාලනයේ විශාලම භූමිකාවක් නියෝජනය කරන කන්ද උඩරට සිටින කෝටිපති ව්‍යාපාරිකයෙකි. කලක් මේ ව්‍යාපාරිකයා ප්‍රසිද්ධ දේශපාලනයේ සිට මේ වන විට දේශපාලනයට සමුදී තිරය පිටුපස සිට දේශපාලන ඩීල් දමමින් සිටින්නකු ලෙස ප්‍රකටය. පසුගිය කාලයේදී අවස්ථා ගණනාවකදීම මේ දේශපාලකයා ඉතා රහසිගතව සජබ මන්ත්‍රීවරුන් සමග කතා කරමින් ඔවුන් ආණ්ඩුවට එක්කර ගැනීමේ මෙහෙයුමක නිරතව සිටියේය. එක් අවස්ථාවකදී මේ ඩීල් ව්‍යාපාරිකයා ප්‍රකාශ කොට තිබුණේ ඉකුත් අයවැයේදී සජබ මන්ත්‍රීවරුන් 40ක් පමණ ආණ්ඩුවට එක්වනවා යැයි කියාය. නමුත් ඔහුගේ එම මෙහෙයුම අසාර්ථක විය.

මීට සති කිහිපයකට ඉහතදී කොල්ලුපිටිය ප්‍රදේශයේ ඉදිකොට ඇති දැවැන්ත ගොඩනැගිල්ක පිහිටි නිවාස සංකීර්ණයක විශේෂ සාකච්ඡාවක් පැවැත්වීමට මේ ඩීල් ව්‍යාපාරිකයා කටයුතු කොට තිබිණි. සමගි ජන බලවේගයේ ජ්‍යෙෂ්ඨයන් 4 දෙනකුට පමණ ඊට ආරාධනා කර තිබූ අතර, අප කිසිසේත්ම නොසිතන නීති ක්ෂේත්‍රයේ නමක් දිනාගෙන සිටින පුද්ගලයකුටද එම සාකච්ඡාවට එන ලෙස මෙම ව්‍යාපාරිකයා ආරාධනා කර තිබිණි. මෙපමණ කල් නීති ක්ෂේත්‍රයේ ප්‍රවීණයකු ලෙස සැලකෙන එවැනි පුද්ගලයකුද ඊට සහභාගි වී සිටීමෙන් බොහෝ දෙනා පුදුමයට පත්ව තිබූ අතර, ඒ පිළිබඳ සොයා බැලීමේදී මීට පෙර අවස්ථාවකදීද මෙම නීති ක්ෂේත්‍රයේ ප්‍රවීණයා රනිල් හා සජිත් අතර එකඟතාවක් ඇතිකිරීමේ මෙහෙයුමක සිට ඇති බවට තොරතුරු 'රාජ්‍ය රහස්' තීරයට අනාවරණ විය.

## රනිල්ට අගමැතිකම...

රාත්‍රී භෝජන සංග්‍රහයක් සමග පැවැති මෙම සාකච්ඡාව ඩීල් ව්‍යාපාරිකයාගේ අවසන් ඩීල් එක ලෙස සැලකිය හැකි ලකුණු පහළ කොට තිබිණේ එහිදී ඉදිරිපත් වූ විශේෂ යෝජනාවක් හේතුවෙනි. මෙහිදී මෙම ව්‍යාරිකයා සාකච්ඡාව ආරම්භ කොට තිබුණේම ජනාධිපතිවරයාට ඉදිරි ජනාධිපතිවරණය ජයග්‍රහණය කළ නොහැකි ස්ථාවරයේ සිටය. මීට පෙරද අප මෙම තීරය ඔස්සේ පෙන්වා දී තිබුණේ ප්‍රධාන පෙළේ ජනමත සමීක්ෂණවලින් සහ ඔත්තු සේවාවලින් කර තිබූ වාර්තා කිරීම්වලින් සජිත් ඉදිරියෙන් සිටින බවකි. ඒ අනුව සජිත් ජනාධිපති වීමෙන් පසු රනිල් අගමැති කිරීම සඳහා මේ ඩීල් ව්‍යාපාරිකයා මෙම රාත්‍රී භෝජන සංග්‍රහයේදී සජබ ජ්‍යෙෂ්ඨයන්ට අලුත් යෝජනාවක් කර තිබිණි. එසේ නොවුණහොත් ජවිපෙ ජයග්‍රහණය කරනු ඇති බවද, ඒ බව සජබයට ඒත්තුගැන්විය යුතු බවද මෙම ව්‍යාපාරිකයා සජබ ජ්‍යෙෂ්ඨයන්ට දැනුම්දී තිබිණි.

මේ සාකච්ඡාවට සහභාගි වූ සජබ ජ්‍යෙෂ්ඨයන්ගේ නම් ගම් සියල්ල අප සතුව ඇති අතර, ඉදිරි තීරණාත්මක මැතිවරණයක් අවස්ථාවේදී ඔවුන් පිළිබඳ තොරතුරු සියල්ල රටට හෙළිකිරීමට අප සූදානම් බවද මෙහිදී සඳහන් කළ යුතුය. මීට අමතරව තවත් කරුණු ගණනාවක්ම මෙම සාකච්ඡාවේදී දෙපාර්ශ්වය අතර සාකච්ඡාවට ලක්විය. කෙසේවෙතත් අවසානයේදී මෙම යෝජනාව සජිත්ට ඉදිරිපත් කරන්නේ කවුරුන්ද යන්න පිළිබඳ ව්‍යාපාරිකයා විමසූ විට සජබ ජ්‍යෙෂ්ඨයන් සියලු දෙනාම කියා සිටියේ තමන්ට එය කළ නොහැකි යැයි කියාය. ඒ නිසා අවසානයේදී එම යෝජනාව සජිත්ට ඉදිරිපත් කිරීමට භාරදුන්නේ එහි සිටි නීති ක්ෂේත්‍රයේ ප්‍රවීණයාටය. එසේ මෙහෙයුම නීති ක්ෂේත්‍රයේ ප්‍රවීණයාට භාරදුන් ඩීල් ව්‍යාපාරිකයා කියා සිටියේ වහාම මෙහෙයුම ආරම්භ කරන ලෙසටත්, තමන් අලුත් අවුරුදු නිවාඩුවට සිංගප්පූරු සංචාරයක නිරත වීමට සැලසුම් කර ඇති බවත්ය.

'දැන් රනිල්ට දිනන්න තියෙන චාන්ස් එක අඩුයි. එයාට පොහොට්ටුව එක්ක ඉල්ලලා දිනන්නත් බෑ. තනිවම ඉල්ලලා දිනන්නත් බෑ. ඒ නිසා හොඳම දේ තමයි සජබෙ ඇතුළට රනිල්ව දාන එක. සජිත් ජනාධිපති වුණාම රනිල් අගමැති කරන යෝජනාව ඕගොල්ලෝ සජිත්ට කියන්න.' යනුවෙන් මෙම ව්‍යාපාරිකයා අවසානයේදී සඳහන් කොට තිබිණි. ඒ අනුව මෙහෙයුම භාරගත් නීති ක්ෂේත්‍රයේ ප්‍රවීණයා පසුගිය දිනෙක සජිත්ට දුරකතන ඇමතුමක් ලබාදී වැඩිදුර තොරතුරු නොපවසා විශේෂ කාරණාවකට මුණගැසීමට අවශ්‍ය බව දැනුම් දීමට පියවර ගෙන තිබිණි. නමුත් වටින් ගොඩින් එන කාරණය කුමක්ද යන්න තේරුම් ගත් සජිත් වැඩි ගණනකට නොගෙන ඔහුට දැනුම් දී තිබුණේ 'හා බලමු' යැයි කියාය. නමුත් සජිත් ඔහුට හමුවීම සඳහා වේලාවක් ලබාදීමට කටයුතු කොට තිබුණේ නැත. එසේ වුවත් සජිත් ඊට පිළිතුරක් හම්බන්තොට පැවැති 'සක්වළ' වැඩසටහනක් අතරතුරදී ප්‍රසිද්ධියේම ලබාදීමට පියවර ගත්තේය. එහිදී සජිත් කියා සිටියේ තමන් කිසිදු ලෙසකින්වත් ඩීල් දේශපාලනයේ නොයෙදෙන බවත්, රාජපක්ෂවරුන් ආරක්ෂා කරන කිසිවකුත් සමග ඩීල් දැමීමට තමන් කටයුතු නොකරන බවත්, ඒ සඳහා යෝජනා හෝ තමන් වෙත රැගෙන නොඑන ලෙසත්ය.

## රංජිත්ගෙන් ලීක් වෙයි...

කෙසේ වෙතත් රනිල්ට අගමැති ධූරය ලබාදීම සම්බන්ධයෙන් පැවැති මේ සාකච්ඡාව සම්බන්ධයෙන් කිසිදු කරුණක් පසුගිය සති දෙක ඇතුළත එළියට පැමිණියේ නැත. එය හදිසියේම එළියට ආවේ සජබ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාර මහතා සහභාගි වූ මාධ්‍ය හමුවකදීය. එහිදී ඔහු කියා සිටියේ සජිත්ට ජනාධිපති ධූරය ලබාදී රනිල්ට අගමැති ධූරය ලබාදීම සම්බන්ධයෙන් වූ යෝජනාවක් මේ වන විට ආණ්ඩුව පාර්ශ්වයෙන් තමන්ට ලැබී ඇතැයි කියාය. ඊට කිසිදු ප්‍රතිචාරයක් නොදක්වන බවද රංජිත් එහිදී කියා සිටියේය. ඒ අනුව අප සිතන්නේ මද්දුමබණ්ඩාර මෙම ප්‍රකාශය කළේ සජිත්ගේ අනුදැනුම මත යැයි කියාය. මන්ද යත් සජිත් හා මද්දුමබණ්ඩාර අතර පවතින්නේ ඉතා දිගුකාලීන මිත්‍රත්වයකි. බොහෝ දෙනා කියන්නේ සජිත්ගේ ආණ්ඩුවක් යටතේ අගමැති ධූරය මද්දුමබණ්ඩාරට හිමිවනු ඇතැයි කියාය. එම නිසා නිසැක වශයෙන්ම මද්දුමබණ්ඩාර ආණ්ඩුව පැත්තෙන් ආ මෙම යෝජනාව පිළිබඳ සජිත් දැනුවත් කිරීමට කටයුතු කරන්නට ඇතැයි සිතිය හැකිය. ඒ එක්කම ඊට ප්‍රතිචාර වශයෙන් තමන් ආණ්ඩුව සමග හෝ ජනාධිපතිවරයා සමග ඩීල් නොදාන බව සජිත්ද කියන්නට ඇත. තත්ත්වය එසේ වුවද අප කළ සොයාබැලීම්වලදී දැනගන්නට ලැබුණේ ආණ්ඩුව පැත්තෙන් රනිල්ට අගමැති ධූරය ලබාදෙන යෝජනාව තවදුරටත් ඉදිරියට ගෙන යෑමට සැදී පැහැදී සිටින බවකි.

ඊට ඇති ලොකුම බාධාවක් ලෙස ආණ්ඩුව මේ වනවිට හඳුනාගෙන ඇත්තේ ජී.එල්., ඩිලාන්, ගොඩහේවා ප්‍රමුඛ කොටගෙන සජබය සමග ගොඩනගා ඇති නව සන්ධානයය. එම නිසා ආණ්ඩුව පැත්තෙන් දිගින් දිගටම උත්සාහ ගනිමින් සිටින්නේ මෙම නව සන්ධානය කඩාකප්පල් කිරීම සඳහාය. සජබය ඇතුළේ සිටින ඔස්තාර්ලා එදත් මේ සන්ධානය කඩාකප්පල් කිරීමට උත්සාහ කළා සේම අදත් සිටින්නේ මෙම සන්ධානය කඩාකප්පල් කිරීමේ උත්සාහයකය. නමුත් මේ ඔස්තාර්ලාගේ සහ මහාචාර්ය ජී.එල්. පීරිස්ගේ අධ්‍යාපන සුදුසුකම් බැලූ විට දෙදෙනා සිටින්නේ අහසට පොළොව මෙන් තැන් දෙකකය. ජී.එල්. යනු විශිෂ්ට දැනුමක් ඇති පිරිසිදු චරිතයක් බව සියල්ලන්ම අවිවාදයෙන් පිළිගන්නා කරුණකි. ඔහුට කවදාවත් වංචා දූෂණ චෝදනා එල්ල වී නැත. නමුත් මේ ඔස්තාර්ලා මේ වන විට ලොකු උත්සාහයක් දරමින් සිටින්නේ ජී.එල්., ඩිලාන්, ගොඩහේවා, වසන්ත යාපා සන්ධානය කඩාබිඳ දමා රනිල්ව කෙසේ හෝ සජබය ඇතුළට ගෙන ඒමටය.

## දේශපාලන බෝම්බ 2ක්...

මෙවැනි පසුබිමක් යටතේ තවත් දේශපාලන බෝම්බ දෙකක්ම පසුගිය සතියේ පත්තු විය. එන් එක් බෝම්බයක් වූයේ පසුගිය කාලය පුරා ආණ්ඩුව සමග හිතවත්ව කටයුතු කරමින් ඩීල් දැමූ සහ ජනපතිගේ උත්සවවලට පවුල් පිටින් ගිය විපක්ෂ මන්ත්‍රීවරුන් රැසකට ජනාධිපතිවරයා අත දිගහැර මුදල් ලබාදී ඇති බවට වූ චෝදනාවය. එහිදී කියැවුණේ විපක්ෂ මන්ත්‍රීවරුන් හය දෙනකුට කෝටි 32කට අධික මුදලක් විමධ්‍යගත අරමුදලෙන් ජනාධිපතිවරයා ලබාදී ඇති බවය. සාමාන්‍යයෙන් විමධ්‍යගත අරමුදල් විපක්ෂ මන්ත්‍රීවරුන්ට ලැබිය යුතු වුවත් එය ලබාදෙන නිශ්චිත ක්‍රමවේදයක් තිබේ. එහිදී විපක්ෂ මන්ත්‍රීවරුන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට පළමුව ව්‍යාපෘති වාර්තා භාරදිය යුතු අතර, පසුව ඊට අදාළ මුදල් වෙන්කිරීම සිදුකරනු ලබයි. එහෙත් එම මුදල් ලබාදීම සිදුකරනුයේ දිස්ත්‍රික් ලේකම්වරුන් හරහාය. නමුත් පළමු වතාවට විපක්ෂයේ තෝරාගත් මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කර ඇති යෝජනා සඳහා ඉතා විශාල මුදලක් වෙන්කිරීමට ජනාධිපතිවරයා මෙවර සෘජුව කටයුතු කිරීම විශේෂ සිදුවීමක් විය.

## සල්ලි ගිය විදිහ...

ඒ අනුව සමගි ජනබලවේගයේ මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වාට රුපියල් පන් කෝටි දෙලක්ෂයක (රු. 50,200,000) මුදලක් ජනාධිපති රනිල් වික්‍රමසිංහ විසින් නිදහස් කර දී තිබේ.

එමෙන්ම සමගි ජන බලවේගයේ ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී අජිත් මාන්නප්පෙරුමට රුපියල් හාරකෝටි අනූනව ලක්ෂ අසූ හයදහස් දෙසිය පනහක් (රු. 49,986,250) ද සමගි ජන බලවේගයේ ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී කාවින්ද ජයවර්ධනට රුපියල් හයකෝටි අනූ ලක්ෂයක (රු. 69,000,000) මුදලක්ද සමගි ජන බලවේගයේ ගාල්ල දිස්ත්‍රික් මන්ත්‍රී ගයන්ත කරුණාතිලකට රුපියල් පන්කෝටි දසලක්ෂයක (රු. 51,000,000) මුදලක්ද ජනාධිපති රනිල් වික්‍රමසිංහ විසින් නිදහස් කරදී ඇත.

එමෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ.එච්.එම්. ෆවුසිට ජනාධිපති රනිල් වික්‍රමසිංහ විසින් රුපියල් අටකෝටි දාසයලක්ෂ හැත්තෑ හත්දහස් තුන්සිය හැත්තෑ හයයි සත අනූ හතරක (රු. 81,677,376.94) මුදලක්ද අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඉෂාක් රහුමාන්ට රුපියල් කෝටි දහයක (රු. 100,000,000) මුදලක්ද ජනාධිපති රනිල් වික්‍රමසිංහ විසින් සෘජුවම නිදහස් කර තිබේ.

## විපක්ෂය කැළඹෙයි...

මේ ආකාරයට ජනාධිපතිවරයා විමධ්‍යගත අරමුදලෙන් විපක්ෂ මන්ත්‍රීවරුන් 6 දෙනකුට කෝටි 32ක් වෙන්කර ඇති බවට වූ ලේඛන මාධ්‍ය විසින් වාර්තා කිරීමත් සමග පොහොට්ටුවත්, සජබයත් බරපතළ කැලඹීමකට ලක්විය. පොහොට්ටුව කැලඹී තිබුණේ ආණ්ඩුව නියෝජනය කරන ඔවුන්ගේ මන්ත්‍රීවරුන්ට හෝ මේ තරම් මුදලක් ජනාධිපතිවරයා විසින් වෙන්කර දී නොතිබුණු නිසාය. සජබය කැලඹී තිබුණේ පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් දිගින් දිගටම සජිත්ටත්, පක්ෂ මහලේකම් මද්දුමබණ්ඩාරටත් මේ සම්බන්ධයෙන් පැමිණිලි ලැබීම නිසාය. එහිදී ඔවුන් පෙන්වා දී තිබුණේ මේ මන්ත්‍රීවරුන් විනිවිදභාවය, පිරිසිදුකම ගැන කතා කළද ආණ්ඩුව සමග ඩීල් දමා සිටින බවටය. මේ සම්බන්ධයෙන් සජබ මන්ත්‍රී කණ්ඩායම් රැස්වීමේදී ප්‍රශ්න කිරීමට මන්ත්‍රීවරුන් රැසක් සූදානමින් සිටියද පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කිරීම නිසා එම මාතෘකාව එදින යටගිය ආකාරයක් දැකගත හැකි විය. නමුත් මන්ත්‍රීවරුන් දිගින් දිගටම ඒ සම්බන්ධයෙන් මද්දුමබණ්ඩාරට පැමිණිලි කර සිටි නිසා මද්දුමබණ්ඩාරද ඒ පිළිබඳව පසුගිය සතියේ මාධ්‍යට ප්‍රකාශයක් කර තිබිණි. මද්දුමබණ්ඩාර පමණක් නොව ඉරාන් වික්‍රමරත්නද මාධ්‍යට ප්‍රකාශයක් කරමින් කියා සිටියේ විමධ්‍යගත අරමුදලෙන් මුදල් වෙන්කිරීම පිළිබඳ තමන්ට එදා සිටම ප්‍රශ්නයක් තිබුණා යැයි කියාය.

P >> 08



# විවාදයෙන් ජවිපෙ කට්ටි පනී

කපිල පුංචිමාන්නගේ

## රාජ්‍ය රහස්

එය මාධ්‍ය වාර්තා කර තිබුණේ මෙසේය.

'විමධ්‍යගත යෝජනා යැයි කියමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු පමණක් මුදල් ලබාගැනීම වැරදි බවත් එම මුදල් ලබාගන්නා සමගි ජන බලවේග පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කරන දේ පක්ෂය තුළ ඉදිරියේදී අනිවාර්යයෙන්ම සාකච්ඡා කරන බවත් සමගි ජන බලවේග පක්ෂ මහලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් මද්දුම බණ්ඩාර ඊයේ (අප්‍රේල් 25 ) පැවසීය.

පෞද්ගලික මන්ත්‍රී යෝජනා සහ ඒවා ඉදිරිපත් කළ ස.ජ.බ. මන්ත්‍රීවරුන් ගැන සොයාබලන බවත් දැනටම එම සජබ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මුදල් ලැබී ඇත්දැයි සොයාබලන බවත් පක්ෂ මහ ලේකම්වරයා අවධාරණය කර කීය.

සමගි ජන බලවේග මන්ත්‍රීවරුන් හයදෙනකුට විමධ්‍යගත යෝජනා හරහා සංවර්ධන කටයුතුවලට රුපියල් කෝටි 32කට අධික මුදලක් ජනාධිපති රනිල් වික්‍රමසිංහ වෙන්කර දීම සම්බන්ධයෙන් සජබ පක්ෂ මහ ලේකම්වරයාගෙන් කළ විමසීමකදී ඔහු මෙම අදහස් පළකළේය.

ජනාධිපතිවරයා මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු පමණක් තෝරාගෙන ඔවුන්ගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවලට අල්ලස් ලෙස මුදල් ලබා දී ඇති බවත් එම ප්‍රතිපාදන තම පක්ෂය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දැනට ම ලබාගෙන ඇත්දැයි සොයාබලන බවත් මහ ලේකම් මද්දුම බණ්ඩාර මහතා කීය.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ රට විකෘති කළද දේශපාලනයේදී තම පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බාගැනීමට ජනපතිට ඉඩ නොදෙන බවත් හෙතෙම පැවසීය.

මැතිවරණ ආසන්නයේ රජය උත්සහ කරන්නේ නොයෙක් පඩුරු ලබාදී සමගි ජන බලවේග මන්ත්‍රිවරුන්ගේ ඡන්ද ලබාගැනීමට බවත් එය අසාධාරණ බවත් විමධ්‍යගත ප්‍රතිපාදන ඇත්තේ සෑම මන්ත්‍රීවරයෙකුටම ලබාදීමට මිස තෝරාගත් අයට දීමට නොවන බවත් හෙතෙම ප්‍රකාශ කළේය.

මේ අනුව, එම මුදල් සජබ මන්ත්‍රීවරුන් පිළිගන්නේ නම් ඒ සම්බන්ධව සමගි ජන බලවේගය පක්ෂයක් ලෙස ගන්නා පියවර දැනටමත් කල්පනා කරමින් ඇති බවද ඔහු වැඩිදුරටත් කීවේය.

මේ අතර, විමධ්‍යගත මුදල් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ව්‍යාපෘතිවලට ලබාදෙන ක්‍රමවේදයට තමා එකඟ නොවන බව සමගි ජන බලවේගයේ කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඉරාන් වික්‍රමරත්න පවසයි.

පාර්ලිමේන්තු පරිශ්‍රයේදී මන්ත්‍රීවරයාගෙන් කළ විමසීමකදී ඔහු ප්‍රකාශ කළේ, විමධ්‍යගත අරමුදල් යනු ජනතා මුදල් බැවින් ඒවා භාවිත කොට මන්ත්‍රීවරුන්ගේ විවිධ ව්‍යාපෘතිවලට සිය නම් යොදා ජනතාව අතරට පත්කිරීම කිසිසේත්ම අනුමත කළ නොහැකි බවය.

විශේෂයෙන්ම තමා එදා පටන් විමධ්‍යගත මුදල් මන්ත්‍රීවරුන්ට ලබාදීමේ එම ක්‍රමවේදය අනුමත නොකළ බවත් එම මුදල් ජනාධිපතිවරයා ප්‍රමුඛ රජය ලබා දෙන්නේ නම් සියලුම මන්ත්‍රීවරුන්ට ලබාදිය යුතු බවත් ඔහු පවසයි.

විශේෂයෙන්ම මෙම මුදල් භාවිතයේදී නිසි සැලසුමක්, පාරදෘශ්‍යභාවයක් සහිත ක්‍රමවේදයක් අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක වියයුතු බවද මන්ත්‍රීවරයා කීය.

ජනාධිපතිවරුන් විසින් මීට පෙර අදාළ විමධ්‍යගත මුදල් මන්ත්‍රීවරුන් විශාල ප්‍රමාණයකට ලබාදී තිබුණ ද මෙවර එය තෝරා බේරා සිදුකරන මට්ටමක් පෙන්නුම් කරන බවද හෙතෙම වැඩිදුරටත් සඳහන් කළේය.'

### බාර් ලයිසන් බෝම්බය...

මේ අතරවාරයේ දෙවැනි දේශපාලන බෝම්බය පිපිරුණේ පළාත් කිහිපයක විපක්ෂයේ ප්‍රබල මන්ත්‍රීවරුන් කිහිප දෙනකු තැබෑරුම් විවෘත කිරීම සඳහා ව්‍යාපාරිකයන් හට මත්පැන් බලපත්‍ර ලබාදීමට සම්මාදම් වී ඇති බවට පැමිණිලි ලැබීමත් සමගය. ඒ ඒ පළාත්වල ආගමික නායකයන් අදාළ ව්‍යාපාරිකයන් සමග කළ සාකච්ඡාවලදී මත්පැන් බලපත්‍ර ලබාදීමට මැදිහත් වූ විපක්ෂ මන්ත්‍රීවරුන් කිහිප දෙනකුගේම නම් එළියට පැමිණ තිබූ අතර, පසුව එම ආගමික නායකයන් අදාළ තොරතුර විපක්ෂ නායක ඇතුළු විපක්ෂයේ ප්‍රබල දේශපාලනඥයන් දෙදෙනකුට ලබාදීමට කටයුතු කොට තිබිණි. ඉදිරියේදී මෙම මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන් දැඩි තීන්දුවක් නොගතහොත් ඔවුන්ගේ නම්ගම් සියල්ල රටට හෙළිකරන බවද එම ආගමික නායකයන් විපක්ෂ නායකවරයාට දැනුම්දී තිබිණි. එමෙන්ම ඩලස් අලහප්පෙරුම මහතාද පසුගිය සතියේදී පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කරමින් කියා සිටියේ මෙසේ බාර් ලයිසන් ලබා දීමට මැදිහත් වූ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ නම් හෙළිදරව් කළ යුතු යැයි කියාය. ඒ අනුව, යම් හෙයකින් කවුරුන් හෝ මෙම මන්ත්‍රීවරුන්ගේ නම් රටට හෙළිකළහොත් පළමුව එය 'මව්රට' ඔස්සේ රටට අනාවරණ කිරීමට අපි සූදානම් බව මෙහිදී සඳහන් කරමු. ඒ, මේ ඩීල් දේශපාලනයට තවදුරටත් ඉදිරියට යා නොදී මේ මොහොතේවත් තිත තැබිය යුතු නිසාය.

### ලන්ච් ඇමක්...

මීට අමතරව පාස්කු ඉරිදා දිනයේදී ජනාධිපතිවරයා සහ විපක්ෂ නායකවරයා මුහුණට මුහුණ මුණගැස්වීමට උත්සාහ දැරූ විපක්ෂයේ තවත් දේශපාලනඥයකු පිළිබඳ 'රාජ්‍ය රහස්' වෙත මේ වනවිට තොරතුරු ලැබී තිබේ. මෙම විපක්ෂ දේශපාලනඥයා සුලෙයිමාන් ටෙරස්හි පිහිටි සිය නිවෙසේ දිවා භෝජන සංග්‍රහයක් සූදානම් කොට ඊට රනිල්ටත්, සජිත්ටත් තවත් ඥාතීන් වන සජබ මන්ත්‍රීවරුන් දෙදෙනකුටත් ආරාධනා කර තිබිණි. රනිල් එම ආරාධනාව පිළිගෙන දිවා භෝජන සංග්‍රහයට පැමිණියද සජිත් ඊට සම්බන්ධ වූයේ නැත. ඒ අනුව බොහෝ දෙනා කියා සිටියේ මෙම දිවා භෝජන සංග්‍රහයද සජිත්ගේ ජනාධිපතිත්වය යටතේ රනිල් අගමැති කරන කුමන්ත්‍රණයේ තවත් එක් කොටසක් යැයි කියාය.

### සජබෙන් තුනක් එජාපයට...

මේ අතර, ඉදිරි දින කිහිපය තුළ ආණ්ඩුව පැත්තෙන් මැයි දිනය ඉලක්ක කොටගෙන විශේෂ ප්‍රචාරක ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ සැලසුමක් ඇති බව 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය. මෙම ප්‍රචාරක ව්‍යාපෘතියෙන් ආණ්ඩුව කියන්නට යන්නේ එජාප මැයි රැලියට සජබ ප්‍රබලයන් තිදෙනකු ගොඩවීමට නියමිතව ඇතැයි කියාය. ඒ අනුව, අපද මේ සජබ මන්ත්‍රීවරුන් තිදෙනා කවුරුන්ද යන්න පිළිබඳ සොයාබැලීමක නිරත වීමු. එහිදී අපට දැනගන්නට ලැබුණේ මීට කලකට පෙර ආණ්ඩුවට එක්වූ වඩිවේල් සුරේෂ්, ආණ්ඩුවේ රාජ්‍ය අමාත්‍යවරියක වන ඩයනා ගමගේ සහ මුජිබර් රහුමාන් ඉවත්වීමෙන් පසු පාර්ලිමේන්තුවට පැමිණි දිනයේ සිටම රනිල් සමග එකට කටයුතු කළ ඒ.එච්.එම්. ෆවුසි යන තිදෙනා මෙසේ එජාප වේදිකාවට ගොඩවීමට සූදානමින් සිටින බවට ප්‍රචාරය කිරීමට ආණ්ඩුව සැලසුම් කර ඇතැයි කියාය.

### විජයදාස රනිල් හමුවෙයි...

පසුගිය සති කිහිපයේ ආණ්ඩුවේ ආන්දෝලනාත්මකම චරිතය බවට පත්ව සිටියේ වෙන කවුරුවත් නොව අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතාය. ඊට හේතුව ආණ්ඩුවේ කැබිනට් ඇමැතිවරයකු වශයෙන් සිටියදීම විජයදාස ශ්‍රීලනිපයේ වැඩබලන සභාපතිවරයා ලෙසට පත්වීමත්, පසුව එම තනතුර අධිකරණය මගින් වාරණයකට ලක්කිරීමත් නිසාය. විජයදාස රාජපක්ෂ මහතා දැනටමත් ප්‍රකාශ කර ඇත්තේ පක්ෂයෙන් තමන්ට ඉල්ලීමක් ඉදිරිපත් වන්නේ නම් ශ්‍රීලනිපයේ ජනාධිපති අපේක්ෂකයා වශයෙන් ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට තමන් සූදානම් යැයි කියාය.

කෙසේ වෙතත් ආණ්ඩුව පැත්තෙන් විජයදාසගේ ප්‍රශ්නය මුල්කරගෙන මතුව ඇත්තේ බරපතළ ගැටලුවකි. ඒ, ශ්‍රීලනිපයේ වැඩබලන සභාපතිවරයා වශයෙන් සිටින චන්ද්‍රිකා පිලේ නිමල් සිරිපාල ද සිල්වා මහතාත්, ශ්‍රීලනිපය විසින් වැඩබලන සභාපති ලෙස තෝරා පත්කරගනු ලැබූ විජයදාසත් එකම කැබිනට් මණ්ඩලයේ අසුන් ගෙන සිටීම නිසාය. දේශපාලනය දන්නා ගොඩක් අය කියන්නේ මෙහිදී ජනාධිපතිවරයාගේ සහාය සහ හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකාගේ සහාය නිමල් සිරිපාලගේ පිලට ඇතැයි කියාය.

කෙසේ වෙතත් වැඩබලන සභාපතිවරයා ලෙස පත්වීමෙන් අනතුරුව විජයදාස ජනාධිපතිවරයාගෙන් හමුවීම සඳහා වේලාවක් ඉල්ලා තිබිණි. එම ඉල්ලීම අනුව විජයදාස හා ජනාධිපතිවරයා අතර මුහුණට මුහුණ විශේෂ සාකච්ඡාවක් පසුගියදා පැවැත්විණි. එහිදී ජනාධිපතිවරයා විජයදාසගේ මුහුණටම කියා සිටියේ, 'මේක ලොකු ප්‍රශ්නයක්. අන්න දැන් ඔයාව පොහොට්ටුවෙන් අයින් කරන්නයි යන්නේ. එහෙම වුණොත් ඒ අය ඔයාව මන්ත්‍රීකමෙනුත් අයින් කරාවි.' යැයි කියාය. ඊට සුපුරුදු සිනාවෙන් යුතුව විජයදාස කියා සිටියේ තමන් ඊට මුහුණ දීමට සූදානම් යැයි කියාය. තමන් ශ්‍රීලනිපයෙන් දේශපාලනය ආරම්භ කළ අයකු බවත්, ඒ හේතුව නිසා තමන් ශ්‍රීලනිපයේ වැඩබලන සභාපති ධුරය භාරගත් බවත් මෙහිදී විජයදාස ජනාධිපතිවරයාට කියා සිටියේය.

### අපේක්ෂකයෝ දෙන්නෙක් බෑ...

ඉන් අනතුරුව ජනාධිපතිවරයා තවත් ප්‍රශ්නයක්ද විජයදාසට ඉදිරිපත් කළේය.

'මට කීප දෙනෙක්ම කිව්වා ජනාධිපති අපේක්ෂකයෝ දෙන්නෙක් ආණ්ඩුව ඇතුළේ ඉන්න බෑ කියලා. මට නම් ඒකට කමක් නෑ. හැබැයි ඇමැතිවරු කියනවා ඒ අයට ඒක ප්‍රශ්නයක් කියලා.' යනුවෙන් ජනාධිපතිවරයා කියද්දී විජයදාස ඊට කිසිදු පිළිතුරක් නොදෙමින් සිනාසුණු ආකාරයක් දැකගන්නට ලැබිණි.

තත්ත්වය එසේ වුවත් අපට ඇති තොරතුරුවලින් කියැවෙන්නේ ඒ වන විටත් ආණ්ඩුවේ ඉහළම තැනකින් විජයදාසව පොහොට්ටුවෙන් ඉවත් කරන ලෙසට පණිවුඩයක් ගොස් තිබූ බවකි. නමුත් පොහොට්ටුව එය මගහරිමින් සිටින බවක් 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය. ඒ සඳහා පොහොට්ටුවට හේතු කිහිපයක්ම තිබේ. ඉන් එකක් වී ඇත්තේ විජයදාසට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගතහොත් චන්ද්‍රිකා පිල ශ්‍රීලනිපයේ බලය අල්ලනු ඇති බවට පොහොට්ටුව වෙත තොරතුරු ලැබී තිබීමය. මන්ද විජයදාස නියෝජනය කරන්නේ චන්ද්‍රිකාට එරෙහි පිලය. අනෙක් අතට විජයදාස යනු මහින්දගේ ගමේම උපන් චරිතයකි. එම නිසා විජයදාසට එරෙහිව මහින්දලා තීන්දුවක් ගනු ඇතැයි සිතිය නොහැකිය. ඊට අමතරව විජයදාසට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගතහොත් ජී.එල්. ඇතුළු කණ්ඩායමට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමටද පොහොට්ටුවට සිදුවේ. නමුත් ඡන්දයක් කට මුල තිබියදී මන්ත්‍රීවරුන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන උසාවි ගොස් ඒ මන්ත්‍රී ධුරය අහෝසි කිරීම දක්වා කටයුතු කිරීමට කාලයක් නොමැති වීමද මෙසේ ඔවුන්ට එරෙහි ක්‍රියාමාර්ග නොගැනීමට හේතුවක් වී ඇත.

### ජවිපෙට ටියුෂන්...

අලුත් අවුරුද්දට පෙර දේශපාලන ක්ෂේත්‍රයේ ප්‍රධාන මාතෘකාවක් බවට පත්ව තිබූ සජිත්-අනුර විවාදය දැන් ඇත්තේ ඇල්මැරුණු තැනකය. ඇත්තම කියනවා නම් ජවිපෙ මෙම විවාදයෙන් ඇනගත්තා යැයි කිවහොත් එය වඩාත් නිවැරැදිය.

දැන් ජවිපෙන් කුමක් කියවුණද සජබ - ජවිපෙ ආර්ථික කමිටු අතර පැවැත්වීමට නියමිතව තිබූ විවාදය සජිත්- අනුර විවාදයක් දක්වා තල්ලු වී ගියේ සුනිල් හඳුන්නෙත්ති කට වරද්දාගැනීම නිසාය.

සජබය ජවිපෙ ආර්ථික කමිටුවට විවාදයක් සඳහා ආරාධනා කරද්දී එය අනුර - සජිත් අතර විවාදයක් විය යුතු බවට යෝජනා කළේ සුනිල් හඳුන්නෙත්තිය. ඒ අනුව ඒ මොහොතේම මුලතිව්වල සිට ප්‍රකාශයක් කරමින් සජිත්, අනුර සමග විවාද කිරීමට තමන් සූදානම් බව කියා සිටියේය.

නමුත් තවමත් අනුර ඒ සම්බන්ධයෙන් වචනයක් හෝ ප්‍රකාශ කොට නැත. ඉන් අනතුරුව ටිල්වින් සිල්වා මාධ්‍ය හමුවට පැමිණ මෙම විවාදය සිදු නොවන තැනට ප්‍රකාශයක් කළේය. හරිනි අමරසූරියද මැද්දට පැන ජනාධිපතිවරයාද ඊට ඇඳාගෙන විවාදය සිදු නොවන තැනට කතා කළාය. ඒ අනුව දැන් විවාදය ඇත්තේ සිදුවෙනවාට වඩා සිදු නොවන තැනකය.

මේ අතරවාරයේ හඳුන්වෙත්ති විසින් කටවරද්දා ගැනීමෙන් පසු අලුත් අවුරුදු නිවාඩුවෙන් අනතුරුව ජවිපෙ පක්ෂ මූලස්ථානයේ සියලු නියෝජිතයන්ට වැඩමුළුවක් සංවිධාන කිරීමට එම පක්ෂය පියවර ගෙන තිබිණි.

සාමාන්‍යයෙන් පක්ෂයක වැඩමුළු පැවැත්වීම සාමාන්‍ය සංසිද්ධියක් වුවත් මෙම වැඩමුළුව අතිවිශේෂ එකක් වූයේ එහිදී කතාබහට ලක්වූ කරුණු මුල්කරගෙනය.

මෙම වැඩමුළුවේදී ජවිපෙ සහ මාලිමාවේ සියලු දෙනාට දැනුම් දුන් කාරණාව වූයේ දේශපාලන වේදිකාවේදී කතාකළ යුතු මාතෘකා සහ කතා නොකළ යුතු මාතෘකා මොනවාදැයි කියාය.

එහිදී සියලු දෙනා එක මතයක සිට කතා කළ යුතු බවත්, ඒ ඒ මාතෘකාවලදී කතා කළ යුතු කරුණු පිළිබඳවත් මෙහිදී දීර්ඝව පැහැදිලි කිරීමක් සිදුකිරීමට පියවර ගෙන තිබිණි.

එමෙන්ම කතා නොකළ යුතු කරුණු මගහරින්නේ කෙසේද, ප්‍රසිද්ධියේ කතා කළ යුතු කරුණු මොනවාද, ප්‍රසිද්ධියේ කතා නොකළ යුතු කරුණු මොනවාද යන්න පිළිබඳවද මෙහිදී සියලු දෙනාටම දැනුම් දීමට ජවිපෙ කටයුතු කොට තිබිණි. දින ගණනක් පුරා පැවැති මෙම වැඩමුළුවෙන් අනතුරුව අපට ඉදිරියේදී ජවිපෙ සාමාජිකයන් සියලු දෙනා එක හඬින් කතා කරන ආකාරය පිළිබඳ දැකගැනීමට හැකි වනු ඇත.

මේ අතර සිංහල අලුත් අවුරුදු දිනවලදී සජිත්-අනුර විවාදය සම්බන්ධයෙන්ද දෙපාර්ශ්වයෙන් පත් කළ සම්බන්ධීකාරකයන් වූ නලින්ද ජයතිස්ස හා නලින් බණ්ඩාර අතර සාකච්ඡා වට කිහිපයක් පැවැත්විණි.

මෙහිදී නලින් බණ්ඩාර නලින්දට කියා තිබුණේ තමන්ට අලුත් අවුරුද්දට බිරිය සහ දරුවන් සමග රත්නපුරේ යෑමට ඇති බැවින් ඉන් අනතුරුව සාකච්ඡා සඳහා දින වෙන්කර ගන්නා ලෙසය. නමුත් එය තමන්ගේ වාසියට ගෙන නලින්ද ජයතිස්ස නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ සජබය විවාදයෙන් පැනයෑමට උත්සාහ කරන බවත්, විවාදය සඳහා දින නියම කරගැනීමට කටයුතු නොකරන බවත්ය.

ඉන් අනතුරුව තවත් නිවේදනයක් නිකුත් කරමින් නලින්ද ජයතිස්ස මැයි මාසයේ දින 4ක් නම්කොට ඒ දින 4න් එකක විවාද කිරීමට අනුර සූදානම් කියා පවසා සිටියේය.

එම ලිපිය මාධ්‍යයට නිකුත් වෙද්දී සජිත් සිටියේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ 'සක්වළ' වැඩසටහන හා එක්වෙමින්ය. වහාම ඊට ප්‍රතිචාර දැක්වූ සජිත් කියා සිටියේ තමන් අනුර සමග විවාද කිරීමට සූදානම් බවකි. එපමණක් නොව එම විවාදයට අමතරව සජබ ආර්ථික කමිටුව හා මාලිමාවේ ආර්ථික කවුන්සිලය අතර විවාදය පැවැත්විය යුතු බවද සජිත් සඳහන් කර සිටියේය.

කෙසේ වෙතත් සජිත් මෙම ප්‍රකාශය සිදුකොට පැය කිහිපයක් ඉක්ම යෑමට මත්තෙන් සජිත්ගේ ලිපි ශීර්ෂය සහිත නිවේදනයක සජිත්ගේ අස්සනද සහිතව අමුතුම ආකාරයේ ව්‍යාජ නිවේදනයක් සමාජ මාධ්‍යයට කිසියම් පාර්ශ්වයක් විසින් නිකුත් කර තිබිණි.

එම නිවේදනයේ සඳහන් වී තිබුණේ මාලිමාව නම්කොට ඇති දින හතරේ විවාද කිරීමට සජිත්ට නොහැකි බවත්, ජුනි 31 වැනි දින විවාදය පැවැත්වීමට සජිත් සූදානම් බවත්ය. නමුත් ජුනි 31 කියා දිනයක් කැලැන්ඩරයේ නොමැති නිසා යම් පාර්ශ්වයක් විසින් සජිත්ව හිතාමතාම අපහසුතාවට පත්කිරීම සඳහා මෙම ව්‍යාජ නිවේදනය මාධ්‍යයට නිකුත් කර ඇති බව සියලු දෙනාටම වටහාගන්නට වැඩි වේලාවක් ගියේ නැත.

සජබයෙන් වහාම නිවේදනයක් නිකුත් කරමින් මෙම නිවේදනය සම්පූර්ණයෙන් අසත්‍යයක් බවත්, කිසියම් පාර්ශ්වයක් විසින් ව්‍යාජ ලෙස නිර්මාණය කළ එකක් බවත් නිවේදනය කර සිටියේ ඒ අනුවය.

ඉන් අනතුරුව නලින් බණ්ඩාර, නලින්ද ජයතිස්ස වෙත ලිපියක් යොමුකරමින් දැනුම් දී තිබුණේ ඒකපාර්ශ්විකව මාධ්‍යයට ලිපි නිකුත් නොකොට මෙම පාර්ලිමේන්තු සතියේ පාර්ලිමේන්තුවට පැමිණ විවාද දෙක සඳහාම දිනයක් නියම කරගැනීමට කටයුතු කරමු යැයි කියාය.

නමුත් නලින්ද ජයතිස්ස ඊට කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොතිබූ අතර, පාර්ලිමේන්තුවට පැමිණීමටද කටයුතු කර නොතිබිණි. ඒ අනුව දැකගන්නට ඇත්තේ ජවිපෙ විවාදය මගහැරීමට කටයුතු කරන ආකාරයකි. එමෙන්ම මේ වන විට ජවිපෙ සභායට පැමිණ ඇත්තේද වෙන කවුරුවත් නොව ජනාධිපතිවරයාගේ උපදේශක වශයෙන් කටයුතු කරන ආශූ මාරසිංහ මහතාය. ආශූද පසුගිය දිනෙක මාධ්‍ය හමුවකදී කියා සිටියේ විවාදය සම්බන්ධයෙන් ටිල්වින් මාධ්‍යයට කියපු දේමය.